# කාර්යය සාධන වාර්තාව - 2016
# செயலாற்றுகை அறிக்கை - 2016
# Performance Report -2016

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சு
Ministry of Housing & Construction

## නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

# කාර්ය සාධන වාර්තාව 2016

දෙවැනි මහල, “සෙත්සිරිපාය”, බත්තරමුල්ල

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



නව රජය යටතේ වර්ෂ 2015 දී මෙරට නිවාස සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳව ඇති වූ ප්‍රබෝධය අපට 2016 වසර තුළ සීඝ්‍ර ඉදිරි ගමනකට පිටුවහලක් විය.අමාත්‍යාංශ ලේකම්තුමිය මෙන්ම අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින විවිධ ආයතනවල සේවයේ නියුතු සියලු තරාතිරම්වලට අයත් කාර්ය මණ්ඩල සාමාජික - සාමාජිකාවන්ගේ දායකත්වය සහ කැපවීම ඉකුත් වසරේ අපගේ ප්‍රගතියට සෘජු බලපෑමක් ඇති කිරීමට සමත් විය.

අප මෙම අමාත්‍යාංශයේ වැඩ භාරගත් අවධිය වන විට මෙරට ජනතාව කොතරම් උග්‍ර හා සංකීර්ණ නිවාස ගැටළු රැසකට මුහුණ දී සිටියේදැයි හඳුනා ගැනීමට ඉවහල් වන නිසි සංගණනයක් වසර ගණනාවක් මුළුල්ලේම සිදු කර නොතිබිණි. එබැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් හරහා 2016 ජුනි මාසයේ සිට සියලු දිස්ත්‍රිකයන්හි විධිමත් නිවාස සංගණනයක් ඇරඹීමට හැකි විය. අප සමාන්‍යයෙන් දැන සිටි පමණද ඉක්මවා ගිය බරපතල මට්ටමේ නිවාස ගැටළු රාශියක් මෙරට පවතින බව අනාවරණය වූයේ මෙම සංගණන ක්‍රියාවලියත් සමඟය. නිදසුනක් ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවතින නිවාස සංඛ්‍යාව 118,000 න් 85,000 ක එනම්, මුළු නිවාස ප්‍රමාණයෙන් 70% ක පමණ ජීවත්වන පුද්ගලයින්ට නිවාස ගැටළු පවතින බව හඳුනාගත හැකි විය. මේ සංගණනය දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ අංග සම්පූර්ණව සිදු කිරීමට මේ වන විට අපට හැකි වී තිබේ. එකී කොට්ඨාශ 331 තුළ පවුල් 2,563,649 කට නොඅඩු ගණනක් නිවාස ගැටලුවලට මුහුණ දී සිටින බව අනාවරණය විය. මේ අනුව උපකල්පනය කළ හැක්කේ දිවයිනේ ජීවත් වන 6,094,982 ක් වන මුළු පවුල් සංඛ්‍යාවෙන් 50%කට නොඅඩු ප්‍රමාණයකට විවිධාකාරයේ ගැටළු පවතින බවය.

2015 වසරේ දී ‘උදාගම්මාන’ වැඩපිළිවෙල නැවත සක්‍රීය කරමින් රුපියල් මිලියන 237.5 ක මුදලක් ආයෝජනය කර ගම්මාන 38ක වැඩ ඇරඹීමට අපට හැකි විය. 2016 වසරේදී පමණක් නව උදා ගම්මාන 148 කට වැඩි සංඛ්‍යාවක වැඩ ඇරඹීමට හැකි විය. මීට අමතරව ‘උදාකළ ගම්මාන’ , ‘විසිරි නිවාස ණය ’, කපලාරු ආධාර, වැලිඔය විශේෂ නිවාස ව්‍යාපෘතිය සහ වකුගඩු රෝගී පවුල් වෙත පිරිනැමෙන නැවත අයකර ගනු නොලබන රුපියල් 500,000 නිවාස ආධාර යන ප්‍රධාන වැඩසටහන් 6 යටතේ මෙම වසර තුළ පවුල් 106,000 කට නොඅඩු සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වෙලාගෙන තිබූ දූෂණය හා සම්පත් නාස්තිය මුලිනුපුටා දැමීමට අපට 2015 සහ 2016 වසරවලදී හැකි විය. ඉන් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි වීම අප ලද ජයග්‍රහණයකි. දූෂණය හා නාස්තිය  මුලිනුපුටා දැමීමෙන් පසු ඒ ඒ ආයතන සතු වත්කම් හා සම්පත් සංවර්ධන කටයුතු වෙනුවෙන් උපරිම මට්ටමින් හා වඩාත් ඵලදායී ලෙස උපයෝජනය කළ හැකිව තිබේ. අපගේ උත්සාහයන් මල්ඵල ගන්වමින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වැනි ආයතන හැකි ඉක්මණින් ලාභ ලබන ආයතන බවට පත්කළ හැකි වනු ඇත. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 2016 වසර තුළ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගත් ආයතනයකි.

අතිගරු ජනාධිපතිතුමන් විසින් 2017 - ‘දිළිඳුකම පිටුදැකීමේ වසර’ ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. මේ කාලෝචිත තේමාව නිවාස සංවර්ධනය හා බද්ධ කරමින් ඉතා අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නැවත අයකර ගනු නොලබන පදනමින් නිවාස ආධාර ලබා දීමේ වැඩසටහනක් සඳහා එතුමන් හා මවිසින් ඉදිරිපත් කළ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුමැතිය හිමි විය. ඒ යටතේ 2017 වසරේ දී  උදා ගම්මාන 500ක් ඉදිකර ජනතා අයිතියට පැවරීම අපගේ ඉලක්කයයි.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන මධ්‍යම පාන්තික ප්‍රජාව වෙනුවෙන් නිවාස 500,000 ක් ඉදිකිරීමේ වැඩසටහන රාජ්‍ය හා පෞද්ගලික අංශවල ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස දැනටමත් ක්‍රියාත්මකය. ඒ අනුව වාද්දුව, පනාගොඩ, රාගම හා හෝමාගම නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.

මෙරට නැවතත් අවතීර්ණය වී ඇත්තේ නිවාස සංවර්ධනයේ ප්‍රබෝධමත් කාලපරිච්ඡේදයකට ය. අතිගරු ජනාධිපතිතුමන්ගේ හා ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ මාර්ගෝපදේශත්වය හා ආශිර්වාදය ඇතිව ග්‍රාමීය හා නාගරික නිවාසකරණයේ අභියෝගාත්මක හා ව්‍යවහාරික ඉලක්ක සපුරාලමින් තිරසාර නිවාස සංවර්ධන වැඩපිළිවෙලකට අප පිවිස සිටිනුයේ දශක දෙකක පමණ නිහඬතාවකින් පසුවය. මෙම අභියෝගාත්මක කාර්යභාරයේ නියැලෙමින් අපගේ ඉලක්ක සපුරාගැනීම සඳහා ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ලැබෙන සහාය මහත් ධෛර්යයක් වන බව සඳහන් කළ යුතුය.

'වසර 2025 දී සැමට සෙවණ' උදාකරලීම අප සැමගේ ඒකායන ප්‍රාර්ථනයයි.

**සජිත් ප්‍රේමදාස**
**නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය**

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



තිරසාර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක් යන අපගේ දැක්ම පෙරදැරි කරගෙන වර්තමාන රජයේ සංවර්ධන වැඩපිළිවෙලෙහි ප්‍රධාන කොටස්කරුවෙකු වෙමින් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ කාර්යය සාධන වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටකිනි.

2025 වන විට මෙරට නිවසක් නොමැති සෑම පුරවැසියෙකුටම නිවසක හිමිකම ලබා දීම අපගේ ඒකායන බලාපොරොත්තුවයි. ඒ සඳහා කෙටිකාලීන මෙන්ම දීර්ඝකාලීන වැඩසටහන් සැලසුම් කරනු ලබන්නේ එම අංශවල වගකීම් දරණ රාජ්‍ය නිලධාරින්ගේ සහයෝගයෙන් ලබා ගන්නා විධිමත් තොරතුරු පදනම් කර ගැනීමෙනි.

මෙවර ලෝක ජනාවාස දිනයේ 30 වන සැමරුම "නිවාසකරණය මුල් තැනට " (Housing at the center) යන තේමාව යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අති දුෂ්කර ප්‍රදේශයක පිහිටි දිඹුලාගල සුගලාදේවීගම නව ගම්මානයේ දී අතිගරු ජනාධිපතිතුමන්ගේ මූලිකත්වයෙන් පවත්වන්නට ලැබීම භාග්‍යයකි.

2016 වර්ෂයේ අප අමාත්‍යාංශය මඟින් ලබා දුන් "විසිරි නිවාස ණය වැඩසටහන" යටතේ නව නිවාස 11,600 ක් ඉදිකළ අතර ආදර්ශ ගම්මාන 148ක නව නිවාස ඒකක 4641 ඉදිකර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමත්, අඩු පහසුකම් නාගරික ජනාවාසවල පවුල් 50,000ක් සවිබල ගැන්වීමත් අඩු පහසුකම් නාගරික ජනාවාසලාභීන් සඳහා නව නිවාස ඒකක 410ක් සංවර්ධනය කිරීමටත් හැකියාව ලැබුණි.

බිත්ති කපලාරු නොකළ නිවාස සඳහා එම නිවාසවල වැඩ නිම කර ගැනීමට සිමෙන්ති ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය ද මේ වර්ෂය තුළ සාර්ථකව සිදු කරන ලදී. තවද විසිරි ණය වැඩසටහන්, සම්පත් සෙවණ වැඩසටහන් මඟින් අප මේ වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීම සතුටු විය හැකි කරුණකි.

වකුගඩු රෝගීන්ගෙන් නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා මෙන්ම අන්ත දුගී අය සඳහා නිවාස ආධාර ලබා දීමටද, සෙවණ ආධාර වැඩසටහන් තුලින් රටේ සෑම තරාතිරමකම පුද්ගලයින් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද, 2016 වර්ෂයේ හැකියාව ලැබු අතර 2017 වර්ෂයේ එම ක්ෂේත්‍රවල විශේෂ ප්‍රගතියක් ලබා ගැනීම අපගේ ඉලක්ක අතර වෙයි.

අප රට තුළ නිවාස සංවර්ධනයේදී ජල පහසුකම් සැපයීම, විදුලිය ලබා දීම ඉඩම් ඔප්පු ලබා දීම, මාර්ග සංවර්ධනය කිරීම හා ආරක්ෂක අලි වැටවල් ඉදිකිරීම වැනි කටයුතුවලදී අනෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි. අප අමාත්‍යාංශයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ප්‍රමුඛ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම හා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යන ආයතන වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබා දීම මෙන්ම අප අමාත්‍යාංශය සම්බන්ධ අනෙකුත් ආයතන වල සහයෝගය ද සාර්ථකත්වයට හේතුවකි.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දී පෞද්ගලික අංශයත් සමඟ තරගකාරිත්වයකින් ඉදිරියට ඒමට ලැබීම ඉමහත් සතුටකි. ගොඩනැඟිලි ඉදිකිරීම්, පාලම් හා උමං මාර්ග, වාරි මාර්ග, ජල සම්පාදන යෝජනා ක්‍රම වැනි ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාරභාවය තහවුරු කිරීමටත්, ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්කිරීමටත් කළාපීය වශයෙන් තරඟකාරිත්වයක් දීමටත් අපට හැකියාව ලැබුණි.

අප රට තුළ සංවර්ධන කාර්යයේදී ප්‍රමාණවත් පුහුණු ශ්‍රම බලකායක් නොතිබීම ඉතා ගැටළු සහගතය. මෙයට පිළියමක් වශයෙන් මෙම වසරේදි ඉදිකිරීම් කර්මාන්ත ශිල්පීන් 9741 ක් සඳහා වෘත්තිය පුහුණුව මෙන්ම ඒ සඳහා අවශ්‍ය වන උපකරණ කට්ටල නොමිලේ ලබා දීම ද සිදු කරන ලදී.

මෙම කාලය තුළ දී රුපියල් මිලියන 6224.77 ක ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ලැබීම ඉමහත් භාග්‍යක් කොට සලකමි. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ශාඛා ආරම්භ කරමින් අවශ්‍ය ගොඩනැගිලි උපකරණ ලබා ගැනීමට පහසුකම් සලසන අතර මෙම සියලු කටයුතු සාර්ථක කර ගැනීමට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය යන ආයතන ගන්නා උත්සහය ප්‍රශංසනීයය.

2016 වර්ෂයේ අපේක්ෂා කළ වැඩපිළිවෙල සාක්ෂාත් කරගැනීමේලා නොමද සහයෝගය ලබාදුන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ට ද, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට මෙන්ම අප අමාත්‍යාංශයේ දැවැන්ත සංවර්ධන වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීම හා නියාමනයෙන් නායකත්වය සපයන ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමන්ටත්, අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුලු කාර්යය මණ්ඩලයට මෙන්ම සියලු සාර්ථකත්වයන් ලඟා කරගැනීම උදෙසා ඇප කැපව කටයුතු කළ ආයතන ප්‍රධානීන් හා සමස්ථ කාර්යමණ්ඩලයට මෙහිලා ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

**ඉන්දික බණ්ඩාරනායක**
**නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍ය**

## ලේකම්තුමියගේ පණිවිඩය



වත්මන් රජයේ සංවර්ධන වැඩපිළිවෙල තුළ කැපීපෙනෙන මෙන්ම අභියෝගාත්මක කාර්යය භාරයක් ඉටු කරනු ලබන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් 2016 වසරේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ආශ්‍රයෙන් සකස් කරනු ලබන කාර්ය සාධන වාර්තාවට පණිවුඩයක් එක් කරනුයේ ඉමහත් සතුටිනි.

2015 වසරේ යලි ඇරඹි ජාතික නිවාස වැඩසටහන සඳහා 2016 වසරේදී රු.මි.6,999 ක දැවැන්ත ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්වූ අතර එම ප්‍රතිපාදනයෙන් 97.82% ක් වැය කරමින් 2016 වර්ෂය තුල සියලුම අමාත්‍යාංශයන් අතරින් ඉහළම මූල්‍ය හා භෞතික ප්‍රගතියක් අත්කරගත් අමාත්‍යාංශය බවට පත්කර ගැනීමට හැකිවීම මෙහිලා අභිමානයෙන් යුතුව සඳහන් කරනු කැමැත්තෙමි.

"සැමට සෙවණ" සලසන රජයේ සංවර්ධන ඉලක්කය ජයගැනීම උදෙසා අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ආදර්ශ ගම්මාන හා විසිරි නිවාස සංවර්ධන (ණය) වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සමගාමීව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ මැතිවරණ ප්‍රකාශය අනුව දියත් කෙරෙන මධ්‍යම පාන්තික නිවාස වැඩසටහන ආරම්භ කිරීම සහ හඳුනා නොගත් කාලික වකුගඩු රෝගයෙන් පෙලෙන දිළිඳු පවුල් මෙන්ම අන්ත දුගී පවුල් සඳහා නිවාස ආධාර වැඩසටහනක්ද දියත් කිරීමට මෙම වසරේදීත් පියවර ගන්නා ලදී. තවද මහල් නිවාස ක්‍රම ප්‍රතිසංස්කරණය, රජයේ කුලී නිවාස වල පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු ප්‍රදානය, නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල භෞතික හා සමාජයීය සංවර්ධන කටයුතු මෙන්ම සහාධිපත්‍ය දේපල සංවර්ධන කටයුතු සඳහා ද දැවැන්ත පියවර රැසක් ගන්නා ලදී.

එමෙන්ම ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ කාර්යක්ෂමතාව හා විශ්වාසනීයභාවය තහවුරු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ආයතන 06 ක් සවිබල ගැන්වීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අදාල කටයුතු දියත් කිරීම මෙන්ම ඉදිකිරීම් කර්මාන්තයේ පුහුණු ශ්‍රම හිඟයට පිළියමක් වශයෙන් 2016 අයවැයෙන් හඳුන්වා දුන් ඉදිකිරීම් ශිල්පීන් 10,000ක් බඳවාගෙන පුහුණු කිරීමේ (ශිල්ප සවිය) ජාතික වැඩසටහන දියත් කිරීමද ඉතා වැදගත්ය. ඒ තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කඩිනම් සංවර්ධනයේ නිත්‍ය පාර්ශවකරුවන් වෙමින් වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබා දායක වීමට හැකි වීම අප ලද භාග්‍යයක් ලෙස සලකමු.

නිවාස සංවර්ධනයේ හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනයේ උන්නතිය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගනිමින්, අවශ්‍ය සම්පත් හා සහය ලබා දෙමින් නිවැරදි කළමනාකාරීත්වයෙන් යුතුව සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා පූර්ණ කැපවීමෙන් අපි කටයුතු කළෙමු. මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ප්‍රතිපත්තිමය තීන්දු බලාත්මක කිරීම උදෙසා අතිගරු ජනාධිපතිතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමන් ප්‍රධාන කොට ගරු අමාත්‍ය මණ්ඩලය ලබා දුන් විශිෂ්ට දායකත්වය පිළිබඳව කෘතවේදී වන අතරම මෙම සියළු සාර්ථකත්වයන් අත්කර ගැනීම සඳහා නිවැරදි නායකත්වයක් ලබා දෙමින් උපදෙස් ලබා දෙන නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමන්ටත්, නිරන්තර සහයෝගය ලබා දෙමින් දිරිගන්වන එම නියෝජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික බණ්ඩාර මැතිතුමාටත් මාගේ ස්තූතිය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද සියළු කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ටද, සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම දායකවෙමින් කැපවීමෙන් කටයුතු කරන අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතනවල ආයතන ප්‍රධානින් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලවලටද මාගේ ස්තූතිය පිරිනමමි.

**ඩබ්:කේ.කේ.අතුකෝරල**
**ලේකම්,**
**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | හැඳින්වීම | 1-2 |
| 02. | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 3-3 |
| 03. | අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | 3-4 |
| | 3.1. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | |
| 04. | අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | 5-5 |
| 05. | අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය | 6-7 |
| 06. | අමාත්‍යාංශයේ ව්‍යුහය | 8-11 |
| | 6.1. පාලන අංශය | |
| | 6.2. සැලසුම් අංශය | |
| | 6.3. නිවාස අංශය | |
| | 6.4. තාක්ෂණ අංශය | |
| | 6.4.1. ඉංජිනේරු සේවා අංශය | |
| | 6.4.2. ඉදිකිරීම් තාක්ෂණ අංශය | |
| | 6.4.3. නාගරික ජනාවාස සංවර්ධන අංශය | |
| | 6.5. ජාතික නිවාස කොමසාරිස් අංශය | |
| | 6.6. මූල්‍ය අංශය | |
| | 6.7. අභ්‍යන්තර විගණන අංශය | |
| 07. | අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන | 13-15 |
| | 7.1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | |
| | 7.2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | |
| | 7.3. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | |
| | 7.4. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | |
| | 7.5. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | |
| | 7.6. රජයේ කර්මාන්තශාලාව | |
| | 7.7. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | |
| | 7.8. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | |
| | 7.9. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | |
| | 7.10. ඕෂන් විව් සංවර්ධන පුද්ගලික සමාගම | |
| 08. | මූල්‍ය ප්‍රතිපාදන | 17-18 |
| 09. | වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය | 19-32 |
| | 9.1. පාලන අංශය | |
| | 9.2. සැලසුම් අංශය | |
| | 9.3. නිවාස අංශය | |
| | 9.4. තාක්ෂණ අංශය | |
| | 9.5. ජාතික නිවාස කොමසාරිස් අංශය | |
| | 9.6. අභ්‍යන්තර විගණන අංශය | |
| 10. | අමාත්‍යාංශය මුහුණපාන ලද අභියෝග | 34-35 |

# 01. හැඳින්වීම

"තිරසාර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක්" යන දැක්ම අනුව යමින් වර්ථතමාන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව නිර්මාණය වූ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන 2016 වර්ෂයේදී කැපී පෙනෙන ප්‍රතිඵල අත්කර ගනිමින් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන අයුරින් හා සියලුම ජන කොට්ඨාස ආවරණය වන අයුරින් ක්‍රියාත්මක විය. අඩු ආදායම්ලාභී ප්‍රජාව, අන්ත දිළිඳු ජන කණ්ඩායම්, නාගරික ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන ප්‍රජාව, වකුගඩු රෝගයෙන් පීඩාවට පත්වූවන්, යුද්ධයෙන් අවතැන්වූවන් හා මධ්‍යම පාන්තිකයින් ඇතුළු සියලුම ජන කොටස් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා 2015 වර්ෂයේ යොදන ලද අඩිතාලම මනා පිටුවහලක් විය.

ශ්‍රී ලංකාවේ පවතින නිවාස ගැටලුව සඳහා ස්ථිරසාර විසඳුමක් ලබාදීමට නිවාස අවශ්‍යතාවය සම්බන්ධයෙන් විධිමත් සංගණනයක් සිදු කළ යුතු අතර යාවත්කාලීන කළ හැකි දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පවතින නිවාස අවශ්‍යතාවය හඳුනාගැනීම සඳහා විධිමත් සංගණනයක් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පැවැත්වීමට 2016 වර්ෂයේදී අමාත්‍යාංශයට හැකියාව ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ වෙසෙන පවුල් 2,563,649 කට කුමන හෝ නිවාස ගැටලුවක් පවතින බවට කරුණු අනාවරණය කර ගන්නා ලදී. එම තොරතුරු පාදක කරගනිමින් නිවාස සංවර්ධන වැඩසටහන මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කෙරිණි.

මේ අනුව නිවාස හා ඉඩම් නොමැති පවුල් සඳහා බිම් කොටසක අයිතියද සමඟ නිවසක හිමිකම ලබාදීමේ උදාගම්මාන වැඩසටහන යටතේ අංග සම්පූර්ණ නව උදාගම්මාන 180 කට වැඩි සංඛ්‍යාවක වැඩ මෙම වර්ෂයේදී ආරම්භ කරන ලද අතර නිවාස ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 3ක ණයක් සහන පොලී අනුපාතිකයක් යටතේ ප්‍රතිලාභී පවුල් සඳහා ලබා දෙන ලදී. මේ යටතේ ඉදිවන නව ආදර්ශ ගම්මානවල ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා විවිධ වූ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් රාශියක්ද ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව "උදාකළ ගම්මාන", විසිරි නිවාස ණය, කපලාරු අධාර, වැලිඔය විශේෂ නිවාස ව්‍යාපෘතිය සහ වකුගඩු රෝගී පවුල් වෙත පිරිනැමෙන රුපියල් 500,000 ක නිවාස ආධාර වැඩසටහන යන ප්‍රධාන නිවාස සංවර්ධන වැඩසටහන් යටතේ පමණක් පවුල් 114,000කට නොඅඩු සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර ඇත.

මධ්‍ය අදායම්ලාභීන් සඳහා නිවාස ලබාදීමේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පය ක්‍රියාවට නංවමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස දිවයිනේ උප නගරාශ්‍රිත ප්‍රදේශවල මධ්‍යම පාන්තික නිවාස ඉදිකිරීමේ කටයුතු මෙම වර්ෂයේදි ආරම්භ කරන ලදී. ඒ අනුව මධ්‍යම පාන්තිකයින් සඳහා දැරිය හැකි මිලක් යටතේ මෙම නිවාස ලබාදීමට යෝජිතය.

එසේම නාගරික ජනාවාසවල ජීවත්වන ජනතාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් බල ගැන්වීම අරමුණු කරගනිමින් ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන්ද ක්‍රියාත්මක කරමින් ප්‍රජාවගේ කුසලතාව, ආකල්ප සංවර්ධන වැඩසටහන් සහ ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් කොළඹ නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන අතර, ඔවුන් ආර්ථික සංවර්ධනයේ සාර්ථක පාර්ශවකරුවන් බවට පත්කිරීමේ මහඟු කාර්යයභාරය ඉටුකරමින් පවතී.

රටක සංවර්ධනයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රය ප්‍රමුඛ කාර්යයභාරයක් ඉටු කරනු ලබන අතර, ඉදිකිරීම ක්ෂේත්‍රයේ සිදුවන ප්‍රසාරණය අනුව ශ්‍රම වෙළඳපොළද ප්‍රසාරණය වේ. කලාපීය හා ගෝලීය වශයෙන් ඇතිවන ප්‍රවණතාවයට හා දේශීය ශ්‍රම වෙළඳපොළ සඳහා මානව සම්පත පරිපූර්ණ කිරීම වෙනුවෙන් උසස් ප්‍රමිතියකින්

යුත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා ශිල්ප සවිය වැඩසටහන යටතේ ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

තවද ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී යටිතල පහසුකම් සංවර්ධන ක්ෂේත්‍රය ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගනී. මහා මාර්ග, පාලම්, වාරිමාර්ග ඉදිකිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ විවිධ ව්‍යාපෘති අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

මේ අනුව ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ පාර්ශවකරුවන් වෙමින් 2016 වර්ෂයේදී අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කනර ලද අතර 2016 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ කාර්යය සාධනය පිළිබඳ වාර්තාව මෙහි අන්තර්ගත වේ.

## 02. අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර




“තිරසාර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක්”




“ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්, වෘත්තීයවේදීන් හා ශ්‍රම බලකාය හැකියාවන් හා සම්පත්වලින් සන්නද්ධ කරමින් සැලසුම්ගත පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීම හා ප්‍රජා සහභාගීත්වයෙන් මූලික පහසුකම් සහිත ජනාවාස බිහිකිරීම, අඩු ආදායම්ලාභී ජනතාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අතින් සවිබලගැන්වීම තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම”

## 03. අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාල ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

## 3.1. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

### නිවාස ක්ෂේත්‍රය

01. අඩු ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම්ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

02. පරිසර හිතකාමී ලෙස වියදමට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳව ග්‍රාමීය ජනතාවට මඟපෙන්වීම.

03.නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

+

### ඉදිකිරීම් ක්ෂේත්‍රය

01. ඉදිකිරීම් විෂයට අදාළ ප්‍රගතීන්, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම හා ඇගයීම.

02. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශක හා නියාමන සේවා සැපයීම සහ බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තුව පිළිබඳ පුහුණුව.

03.අදාල නීති රීති හා ප්‍රමිතිවලට අනුකූලව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය.

+

### ඉංජිනේරු ක්ෂේත්‍රය

01.රාජ්‍ය ආයතන සඳහා යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.

02. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම.

+


### පොදු පහසුකම් ක්ෂේත්‍රය

01. සහාධිපත්‍ය දේපළ කළමනාකරණ හා නියාමන කටයුතු

02. මහජන සහාධිපත්‍ය දේපළ ප්‍රතිසංස්කරණ කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.

→ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

# 04. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය




ගණ.-ගණකාධිකාරී
නි. අ.-නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස. ලේ.-සහකාර ලේකම්
ස. අ.- සහකාර අධ්‍යක්ෂක

නී. නි.-නීති නිලධාරී
ප. නි.-පරිපාලන නිලධාරී
පරි.-පරිවර්තක
තො. තා. නි.- තොරතුරු තාක්ෂණ නිලධාරී

සං. නි.-සංවර්ධන නිලධාරී
තා.නි.- තාක්ෂණ නිලධාරී
ප්‍ර.ස.- ප්‍රමාණ සමීක්ෂක


ක. ස.- කළමනාකරණ සහකාර
රි.- රියදුරු
කා. කා. ස.- කාර්යාල කාර්යය සහායක

# 05. අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

| අනු අං. | | වැටුප් ක්‍රමය | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලේකම් | SL 4 | | 01 |
| 02 | අතිරේක ලේකම්(පාලන හා මුදල්) | SL 3 | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 |
| 03 | අතිරේක ලේකම්(නිවාස හා සංවර්ධන) | SL 3 | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 |
| 04 | අතිරේක ලේකම්(කාර්මික) | SL 3 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 05 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | SL 3 | ශ්‍රී.ලං.ග.සේ.විශේෂ | 01 |
| 06 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන) | SL 1 |ශ්රි.ලං.ප.සේ.1 | 01 |
| 07 | අධ්‍යක්ෂ (නිවාස හා සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.1 | 01 |
| 08 | අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 09 | අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ක්‍රම.සේ.1 | 01 |
| 10 | අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 11 | අධ්‍යක්ෂ(නාගරික ජනාවාස සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01 |
| 12 | නිවාස කොමසාරිස්<br>ප්‍රධාන ගණකාධිකාරී | SL 1<br>SL 1 | -<br>ශ්‍රී.ලං.ඉ.සේ.1 | 01<br>01 |
| 13 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (නිවාස හා සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.11/111 | 02 |
| 14 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.11/1,11/11 | 01 |
| 15 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ක්‍රම.සේ.11/1,11/ 11 | 01 |
| 16 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.11/1,11/11 | 01 |
| 17 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ.11/1,11/11 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (නාගරික ජනාවාස සංවර්ධන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.11/111 | 01 |
| | | | ශ්‍රී.ලං.ඉ.සේ.11/11 | 01 |
| 19 | සහකාර ලේකම්(පාලන ) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ.111 | 02 |
| 20 | ගණකාධිකාරි | SL 1 | ශ්‍රී.ලං.ග.සේ.11/1,11/11 | 02 |
| 21 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SL 1 | ශ්‍රී.ලං.ග.සේ.1 | 01 |
| 22 | නීති නිලධාරි | SL 1 | දෙපාර්තමේන්තුගත | 01 |
| 23 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | SL 1 | ශ්‍රී.ලං.තො.තා.සේ.2/II | 01 |
| 24 | පරිපාලන නිලධාරී | MN7 | රා.ක.ස.සේ.(අධි) | 01 |
| 25 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්(තාවකාලික තනතුරකි ) | -- | -- | 01 |
| 26 | භාෂා පරිවර්තක | MN6 | භාෂා පරිවර්තක සේවය | 02 |
| 27 | අයවැය සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 01 |
| 28 | සැපයුම් සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 01 |
| 29 | සංවර්ධන සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 25 |
| 30 | නිවාස සංවර්ධන සහකාර | MN4 | ආශ්‍රිත නිලධාරි | 11 |
| **31** | සංවර්ධන නිලධාරී | MN4 | ආශ්‍රිත නිලධාරි | 19 |
| 32 | කළමනාකරණ සහකාර | MN4 | රා.ක.සේ. | 43 |
| 33 | කාර්මික නිලධාරි | MT2 | ශ්‍රී.ලං.තා.සේ. | 05 |
| 34 | ප්‍රමාණ සමීක්ෂක | MT2 | ශ්‍රී.ලං.තා.සේ. | 01 |
| 35 | රියදුරු | PL3 | රියදුරු සේවය | 26 |
| 36 | කාර්යාල කාර්ය සහයක | PL1 | කා.කා.සේ | 26 |
| **37** | වීඩියෝ කැමරාකරු (තාවකාලික) | | | 01 |
| **38** | නිශ්චල ඡායාරූපශිල්පි (තාවකාලික) | | | 01 |
| **39** | කාර්යාල ශිල්පි සහායක (තාවකාලික) | | | 01 |
| මුළු තනතුරු සංඛ්‍යාව | | | | **193** |

# 06. අමාත්‍යාංශයේ ව්‍යුහය



## 6.1.පාලන අංශය

"නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදීත්, මහජන සුභසිද්ධිය පිණිස සිදු කරනු ලබන විවිධ කර්තව්‍යයන්හීදිත්, අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහය ලබා දීමත් ඒ සඳහා අවශ්‍ය වැඩ පරිසරය සකස් කිරීම, මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම පාලන අංශය මඟින් සිදු කරනු ලබයි."

### පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ ආයතනික කටයුතු පවත්වාගෙන යාම.
2. අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදුකිරීම.
3. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම.
4. අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකරන සියලුම පරිපාලන කටයුතු.
5. අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සම්බන්ධ කටයුතු.
6. අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.
7. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
8. ඵලදායිතා ක්‍රියාකාරකම් පැවැත්වීම.
9. අමාත්‍යාංශයේ කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.
10. අමාත්‍යාංශ නිලධාරීන් සඳහා පුහුණු සැසි පැවැත්වීම.

## 6.2.සැලසුම් අංශය

"අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සංවර්ධන වැඩසටහන් සැලසුම්කල පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීම සඳහා මෙහෙයවීමට සහාය වීම."

"නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මඟින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීම."

"නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතනවලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා මුදල් අමාත්‍යාංශය මඟින් අනුමත කරවා ගැනීමට සහායවීමත් සැලසුම් අංශය මඟින් සිදු කරනු ලබයි."

### සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණුවලට අදාලව අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනවල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.

2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මාසික හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇගයීම.

3. අයවැය විවාද කාරක සභා අවස්ථාව වෙනුවෙන් අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස්කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

4. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.

5. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල ව්‍යාපෘති යෝජනා, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.

## 6.3.නිවාස අංශය

"නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලඟා කර ගැනීම සඳහා නිවාස සංවර්ධන හා පොදු පහසුකම් යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම,මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මඟ පෙන්වීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි."

### නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ප්‍රතිපත්ති සම්පාදනය
   - නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍යවන ප්‍රතිපත්ති සම්පාදනය
   - නිවාස ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.
   - අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව සංවර්ධනය කිරීම.
   - දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.
   - ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක

කිරීම හා ලෝක ජනාවාස දිනය සැමරීම.

2. ඉඩම් රාජකාරි
- නිවාස සංවර්ධන අරමුණු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම / පවරා ගැනීම සම්බන්ධ කටයුතු.
- නිවාස අරමුණු සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/නිවාස වල නීතිමය අයිතිය ජනතාවට බැහැර කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල අනවසරයෙන් නිවාස ඉදිකර පදිංචි වී ඇති පදිංචිකරුවන්,අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව නියමානුකූල කිරීම.

3. නිවාස සංවර්ධනය
- රටේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි නිවාස ඉදිකිරීම් වැඩසටහන් හා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.
- නිවාස ණය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නිවාස යෝජනා ක්‍රමවලට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශීය හා විදේශීය ආයෝජකයින් සමග නිවාස ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- අඩුපහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව නගා සිටුවීම.

## 6.4.තාක්ෂණ අංශය

### 6.4.1. ඉංජිනේරු සේවා අංශය

“ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සාධාරණ හා දැරිය හැකි මිල ගණන් නියම කිරීම තුළින් සමස්ත ඉදිකිරීම් කර්මාන්තයේ, මුළු ඉදිකිරීම් පිරිවැය පාලනය කිරීමත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විනිවිද භාවයකින් යුතුව සාධාරණ මිල ගණන් අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට සහාය වීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.”

**ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. රජයේ ආයතනවල ඉදිකිරීම් සම්බන්ධ ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතීන් ලබා දීම.

2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.

3. කොන්ත්‍රාත් විචලනයන් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම.

4. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණ ලබා දීම.

5. කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල දත්ත පද්ධති හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල මිල ගණන් පිළිබඳ දත්ත පද්ධති පවත්වා ගෙන යාම.

### 6.4.2. ඉදිකිරීම් තාක්ෂණ අංශය

“පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීමට අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මෙහෙයවීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි.”

**ඉදිකිරීම් තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. ඉදිකිරීම් අංශයට අනුබද්ධිත ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.

2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සූදානම් කිරීම.

3. වෘත්තීයවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.

### 6.4.3. නාගරික ජනාවාස සංවර්ධන අංශය

“ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශයන්හි වාසය කරනු ලබන අඩු ආදායම්ලාභී ජනතාවට හා අනෙකුත් ජනතාවට අවශ්‍ය පරිදි පදිංචි වීමට හැකියාව පවතින, පහසුකම්වලින් සමන්විත නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් මෙහෙයවීම හා නාගරික ජනාවාස සංවර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.”

### නාගරික ජනාවාස සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනාව අමාත්‍යාංශ ස්ථාවර ව්‍යාපෘති ඇගයීම් කමිටුව හරහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

2. නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

## 6.5.ජාතික නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය මඟින් 1973 අංක 01 දරණ නිවාස දේපල උපරිමය නීතිය යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටු කරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුලී පනත යටතේ පැවරී ඇති කාර්යයන් ද ඉටු කරනු ලබයි.

ඉහත දක්වා ඇති අණපනත් මගින් ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රධාන අරමුණ වන කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම, රජයට පවරා ගත් නිවාසවල අයිතිකරුවන්ට වන්දි ලබා දීම වැනි ඉලක්ක සපුරා ගැනීමට මෙම අංශය විසින් ක්‍රියා කරනු ලබයි.

## 6.6. මූල්‍ය අංශය

"අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍යවන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබා දීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. "

### මූල්ය අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අරමුදල් පිළිබඳ සැලසුම් කිරීම.

2. අයවැයකරණය.

3. අරමුදල් නිසි ප්‍රමාණයට, නිසි වේලාවට ලබා ගැනීම.

4. අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් නිකුත් කිරීම හා වියදම් කිරීම.

5. අදාල පාර්ශවයන් වෙත වියදම හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව නියමිත දිනයන්ට හෝ ඊට පෙර වාර්තා කිරීම.

## 6.7.අභ්‍යන්තර විගණන අංශය

"ආයතනයන්හි අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කර ගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි."

අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගි වී එම කටයුතු වඩාත් විධිමත්ව සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මඟ පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් සහායවීම ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

# 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්




වැලිඔය ඉසුරුපුර ආදර්ශ ගම්මානය විවෘත කිරීම



තිස්සමහාරාමය, සහන ගම ආදර්ශ ගම්මානය විවෘත කිරීම



හම්බන්තොට, සංහිඳගම ආදර්ශ ගම්මානය විවෘත කිරීම



දෙල්තොට, රන්කෙත්ගම ආදර්ශ ගම්මානය විවෘත කිරීම



කුරුණෑගලගම, එදිරිමනගම ආදර්ශ ගම්මානය විවෘත කිරීම



බුලත්සිංහල, නවෝද්‍යාගම ආදර්ශ ගම්මානය විවෘත කිරීම

# 07.අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

## 7.1.ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ස්ථාපිත කර ඇත.මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ නාගරික කාර්යාල 02 ක් මගින් දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ කටයුතු මෙහෙයවනු ලබයි.

## 7.2.නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත අනුව පිහිටුවන ලද මෙම අධිකාරිය විසින් තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් හා අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කටයුතු කරනු ලබයි.

## 7.3.සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතින් පිහිටුවනු ලැබූ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, සභාධිපත්‍ය ඉදිකිරීම් හා කළමනාකරණය සම්බන්ධ නියාමන අධිකාරිය වේ. තවද 1982 අංක 45, 2003 අංක 39 යන පනත්වලින් සංශෝධිත බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ නියමයන් නියාමනය කිරීම මෙම අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වේ.

## 7.4.රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අංක 12841 දරණ 1962 ජනවාරි 01 වැනි දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ අනුමැතියෙන් සංස්ථාපනය කරන ලද ආයතනයකි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම ආයතනයකි. මෙමගින් ඉදිකිරීම් උපදේශන සේවා ලබාදීම, ඉදිකිරීම් සඳහා ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය කිරීම, පෙරසවි/පෙරදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබා දීම මෙන්ම පර්යේෂණ කටයුතු ද සිදු කරනු ලබයි.

එසේම,මෙම සංස්ථාව 2009 වසරේ සිට ISO 9001:2000 තත්ත්ව සහතිකයෙන් හා මෑත කාලයේ දී ISO 14001:2004 පරිසර කළමනාකරණ සහතිකයෙන් ද පිදුම් ලබා තරඟකාරීව ඉදිරි කටයුතු කරගෙන යනු ලබන ඉදිකිරීම් ආයතනයකි.

## 7.5.ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ආරම්භයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කොටසක් වශයෙන් පැවති මෙම ආයතනය

1969 දී "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරනු ලැබීය.එකල සියලුම රජයේ ගොඩනැගිලි සහ ඊට අදාල සේවාවන්ගේ ඉදිකිරීම් කටයුතු සහ නඩත්තු කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් අතර, එම සියලු කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල 27 ක් මගින් හා 500කට අධික ස්ථිර සේවකයින් පිරිසක් මගින් ඉටුකරනු ලැබීය.

වර්ෂ 1989 දී 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභාවලට බලය පැවරීමත් සමඟ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ මුළු දිවයිනම ආවරණය වන පරිදි පිහිටවනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු කාර්යාල 7ක් ලෙසට ප්‍රතිසංවිධානය විය.

## 7.6. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ආයතන සඳහා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ලෝහ හා වඩු කර්මාන්ත ආශ්‍රිත වැඩ, භාණ්ඩ හා සේවා සැපයීමේ කාර්යයන් සහ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩබල පුහුණු කිරීමේ කටයුතු කරනු ලැබේ.

## 7.7.රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 ඔක්තෝම්බර් 01 වන දින ඉංජිනේරු සංවිධානයක් ලෙස ස්ථාපිත කරන ලද අතර, මේ වන විට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම සංස්ථාව ප්‍රධාන පෙළේ ඉංජිනේරු ආයතනයක් ලෙස පාලම් හා මාර්ග, ගොඩනැගිලි, උමං, වාරිමාර්ග හා ජල සම්පාදන යෝජනා ක්‍රම යනාදිය සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ඉදිකිරීම් තුළින් මෙරට යටිතල පහසුකම් සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයන අතර පාලම් ඉදිකිරීම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනයක් ද වෙයි. එසේම උමං ඉදිකිරීමට හැකියාවක් ඇති එකම ශ්‍රී ලාංකික ආයතනය ද මෙම සංස්ථාවයි.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් මෙම සංස්ථාව C1 ශ්‍රේණියේ ඉදිකිරීම් ආයතනයක් ලෙස ලියාපදිංචි කර ඇති අතර, එම ආයතනය මගින් පිරිනමන ලද, ඉදිකිරීම් කාර්යය සාධනය පිළිබඳ සම්මානයද දිනා ඇත.

ISO 9001:2008 තත්ත්ව සහතිකය ද හිමිකර ගෙන ඇති මෙම සංස්ථාව ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට අනුව සිදු කරනු ලබයි.

මෙම සංස්ථාව ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය පෙරසවි(පෙරැදි) කොන්ක්‍රීට් පාලම්, බාල්ක, විදුලි කණු සහ අනෙකුත් සියලුම පෙරසවි(පෙරැදි) කොන්ක්‍රීට් නිෂ්පාදනය කරනු ලබයි. මීට අමතරව, මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම මාර්ග සංඥා පද්ධති නඩත්තු කිරීම සහ නව පද්ධති සවිකිරීම ද මෙම සංස්ථාව මගින් සිදු කරනු ලබයි.

## 7.8.ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බවට පරිවර්තනය කර ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම,

විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණු වේ.

මෙම පනත යටතේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුබසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතුවලට අදාල ආරවුල් නිරවුල් කිරීම සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ද විධිවිධාන සලසා ඇත.

මෙම පනතෙහි සඳහන් පරමාර්ථ හා කාර්යයන් මේ වනවිට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.

## 7.9. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ සංස්ථා පනත යටතේ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව 1971 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. අනතුරුව 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ 1992 වර්ෂයේ සැප්තැම්බර් මසදී සමාගම් පනත මගින් සීමිත වගකීම් සහිත පොදු සමාගමක් බවට පරිවර්තනය කරන ලදී.

නිවාස හා යටිතල පහසුකම් සැපයීමේ ක්ෂේත්‍රයට අවශ්‍ය ප්‍රමිතිගත ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපකරණ තරඟකාරී මිලකට දිවයින පුරා සපයමින් ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ සැපයීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස සමාජ වගකීම් ඉටුකරමින් ශ්‍රී ලාංකේය ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනගා ගනිමින් සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සිය කටයුතු මෙහෙයවනු ලබයි.

## 7.10.ඕෂන් විව් සංවර්ධන පුද්ගලික සමාගම

1996 ජනවාරි මස 01 වැනි දින ඕෂන් විව් සංවර්ධන පුද්ගලික සමාගම ආරම්භ කරනු ලැබීය.

"සැමටසෙවණ" නිවාස දසලක්ෂයේ ජාතික ප්‍රතිපත්තියට සවිය දෙන රාජ්‍ය සමාගමක් ලෙස විශ්වාසය හා වගකීමත්, පුද්ගලික ආයතනයක් ලෙස කාර්යක්ෂමතාවයත් පෙරදැරි කරගත් මෙම සමාගම අද වන විට නිවාස වෙළඳපොළෙහි පැහැදිලි වෙනසක් ඇති කරමින් නිවාස අවශ්‍යතාවය සපුරාලීමට ඉදිරිපත්ව සිටී.

# 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්




වාද්දුව සී බ්‍රීස් ව්‍යාපෘතිය ආරම්භ කිරීම




අතුරුගිරිය ග්‍රීන් වැලි ව්‍යාපෘතිය ආරම්භ කිරීම




රාගම ලාවන්‍යා හයිට්ස් ව්‍යාපෘතිය ආරම්භ කිරීම



සොයිසාපුර පුනස්ථාපන නිවාස ව්‍යාපෘතිය



ආලෝකපුර නිවාස යෝජනා ක්‍රමය



කළමනාකරණ සංස්ථා පිහිටුවීම

# 8. මූල්‍ය ප්‍රතිපාදන

2016 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද සමස්ත මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය හා එම මූල්‍ය ප්‍රතිපාදනයන්හි 2016.12.31 දිනට ප්‍රගතිය පහත දක්වා ඇත.

## ❖ අමාත්‍යාංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ(දළ) ප්‍රතිපාදන | තථ්‍ය වියදම |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 351,625,000 | 1,208,327,100 | 1,176,310,755 |
| ප්‍රාග්ධන වියදම් | 2,017,750,000 | 6,594,750,000 | 6,556,128,736 |
| | **2,369,375,000** | **7,803,077,100** | **7,732,439,491** |
| | | | |

## ❖ වැඩසටහන් අනුව

<u>වැඩසටහන් 1 මෙහෙයුම් ක්‍රියාකාරකම්</u>

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ(දළ) ප්‍රතිපාදන | තථ්‍ය වියදම |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 243,625,000 | 595,327,100 | 574,926,775 |
| ප්‍රාග්ධන වියදම් | 8,750,000 | 45,750,000 | 10,175,600 |
| | **252,375,000** | **641,077,100** | **585,102,375** |
| | | | |

<u>වැඩසටහන් 1 මෙහෙයුම් ක්‍රියාකාරකම්</u>

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ(දළ) ප්‍රතිපාදන | තථ්‍ය වියදම |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 108,000,000 | 613,000,000 | 601,384,000 |
| ප්‍රාග්ධන වියදම් | 2,009,000,000 | 6,549,000,000 | 6,545,953,136 |
| | **2,117,000,000** | **7,162,000,000** | **7,147,337,136** |
| | | | |

# රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

**විෂය අංක** 123011
123012

| | උපරිම හර සීමාව | අවම බැර සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| **අනුමත සීමාවන්** | 12,000,000 | 7,000,000 | 75,000,000 |

| | | |
|---|---|---|
| **වර්ෂය ආරම්භයේ ශේෂය (2016.01.01)** | | 22,387,314 |
| **වර්ෂය තුළ මුළු හර කිරීම්** | | |
| 123011 | 9,808,083 | |
| 123012 | 3,380,312 | 13,188,395 |
| | | 35,575,709 |
| **වර්ෂය තුළ මුළු බැර කිරීම්** | | |
| 123011 | 5,778,955 | |
| 123012 | 6,215,610 | (-11,994,565) |
| | | 23,581,144 |

# 9. වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය

## 9.1.පාලන අංශය

❖ **අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2016.01.01 දිනට 182ක් විය. 2016 වර්ෂය තුළ මෙම කාර්යය මණ්ඩලයට අමතරව රියදුරු තනතුරු 04ක් කාර්යාල කාර්යය සහයක සේවක සේවයේ තනතුරු 04ක්, වීඩියෝ කැමරාකරු තනතුරු 01ක්, නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරු 01ක් හා කැමරා ශිල්පී සහයක තනතුරු 01ක් වශයෙන් නව තනතුරු 11ක් අනුමත කර ගැනීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර ඒ අනුව සමස්ත තනතුරු ප්‍රමාණය 193 දක්වා වැඩි වී ඇත.

අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී ගණයට අයත් අතිරේක ලේකම්(නිවාස හා සංවර්ධන) තනතුර 2015 වර්ෂයේ අවසාන භාගයේ සිට පුරප්පාඩුව පැවති අතර මෙම වර්ෂයේදී ඒ සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කර ගැනීමට හැකියාව ලැබිණි. එමෙන්ම 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ජාතික නිවාස කොමසාරිස් ධුරය සඳහා නිලධාරියෙකු පත් කිරීමට හැකි විය. එමෙන්ම වර්ෂ ගණනාවක් මුළුල්ලේ පුරප්පාඩුව පැවති අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර සඳහා පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කර ගත හැකි වූ අතර, ප්‍රධාන ගණකාධිකාරී තනතුරෙහි පුරප්පාඩුවද කෙටි කාලයක් තුළ සම්පූර්ණ කරගැනීමට හැකි විය.

2016 වර්ෂය තුළ නිලධාරීන් ස්ථාන මාරු වීම මත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) තනතුර ද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර ද, අධ්‍යක්ෂ (නිවාස හා සංවර්ධන) තනතුර හා නිලධාරීන් විශ්‍රාමයාම මත අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) තනතුරු ද පුරප්පාඩු වූ අතර වර්ෂාවසානය වන තෙක්ම එම තනතුරු සඳහා ස්ථිරව නිලධාරින් අනුයුක්ත කර ගැනීමට නොහැකි විය. කෙසේ වුවද සේවා අවශ්‍යතාවයන් සලකා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා අධ්‍යක්ෂ (නිවාස හා සංවර්ධන) යන තනතුරු වල වැඩ බැලීම සඳහා නිලධාරීන් පත් කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකසන ලදී. එමෙන්ම ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු 15න් 3ක් පමණක් සම්පූර්ණ කර ගැනීමට හැකි වූ අතර රියදුරු තනතුරු පුරප්පාඩු 04ක් විවෘත බඳවා ගැනීම මඟින් සම්පූර්ණ කරගැනීමට කටයුතු කරන ලදී.

ද්විතීය හා ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන් මිය යාම, ස්ථාන මාරු වීම, විශ්‍රාම යාම හා සේවය හැරයාම හේතුවෙන් 2016 වර්ෂය අවසන් වන විට අමාත්‍යාංශයේ පැවති සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 38 ක් විය.

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ හා පාර්ලිමේන්තු ප්‍රශ්න**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන නිවාස හා ඉදිකිරීම් කටයුතු හා අමාත්‍යාංශය යටතට ගැනෙන අනුබද්ධිත ආයතනවල ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පරිපාලන, මෙහෙයුම් හා සංවර්ධන කටයුතුවලට අදාලව 2016 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩල සංදේශ 43ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 9ක් ඉදිරිපත් කරන ලදී.

එමෙන්ම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතනයන්හි විෂය පථයට අදාලව 2016 වර්ෂයේ දී අසන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලබා දීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර ඇත.

තවද ආංශික අධීක්ෂණ කාරක සභා ප්‍රශ්න 08ක් මෙම වර්ෂය තුළ දී අමාත්‍යාංශය වෙත යොමු වී ඇති අතර ඒ සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කර ඉදිරිපත් කරන ලදී.

❖ **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.**

මෙම අමාත්‍යාංශයේ විෂය පථය අනුව ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ඉල්ලීම් සම්බන්ධයෙන් වන අතර ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මහජන පෙත්සම් කාරක සභාව හා ඔම්බුඩ්ස්මන් මඟින් ද ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි.

එම සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් ම අදාල අංශ ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් සම්බන්ධ කර ගෙන මැදිහත් වී කටයුතු කිරීමට අමාත්‍යාංශය නොපමාව කටයුතු කර ඇත. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාල වන ඉල්ලීම්, සේවක ගැටළු ආදිය සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් මඟින් තොරතුරු කැඳවා ඉල්ලුම්කරුවන් වෙත ප්‍රතිචාර දැක්වීමට කටයුතු කර ඇත.

එමෙන්ම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතනවල නිලධාරීන්, සේවක මහත්ම මහත්මීන්ට අදාල වෘත්තීය හා ආයතනික ගැටළු සඳහා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් අදාල පාර්ශව සමඟ සාකච්ඡා කර ඵලදායී විසඳුම් ලබා දීමට කටයුතු කර ඇත.

❖ **පුහුණු හා ඵලදායිතා ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන, ගිණුම් කටයුතු, ආයතනික කටයුතු, ඵලදායිතා ක්‍රියාකාරකම්, පෞරුෂත්වය සංවර්ධන හා ධාරිතා සංවර්ධන වැනි හඳුනාගත් පුහුණු වැඩසටහන් සඳහා මාණ්ඩලික නිලධාරීන් ඇතුළු විවිධ නිලධාරී කාණ්ඩ ආවරණය වන පරිදි නිලධාරීන් සහභාගී කර ඇති අතර අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධන වැඩමුළුවක්, ඵලදායීතා පුහුණු වැඩමුළුවක් හා ISO හඳුන්වාදීමේ වැඩමුළුවක් 2016 වර්ෂය තුළ පැවැත්වීමට කටයුතු කරන ලදී.

මීට අමතරව අමාත්‍යාංශ නිලධාරීන් විෂයානුබද්ධ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරන ලද අතර 2016 වර්ෂය තුළ එලෙස දේශීය වශයෙන් පුහුණුව ලබාගත් නිලධාරීන් ගණන 22ක් ද විදේශීය පුහුණුව ලබාගත් නිලධාරීන් ගණන 4ක් ද වේ.
තවද රජයේ හා රජයට අනුබද්ධිත ආයතනවල තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලා හදාරන ලද අභ්‍යාසලාභීන් 22ක් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීමට 2016 වර්ෂය තුළ දී අමාත්‍යාංශය කටයුතු කර ඇත.

❖ **මැදි ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ කඩිනම් වැඩසටහනේ වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකය ස්ථාපිත කිරීම**

මධ්‍ය අදායම්ලාභී රාජ්‍ය හා රාජ්‍ය නොවන සේවකයින් සඳහා නිවාස ඉදිකිරීමේ කඩිනම් වැඩ සටහන වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකයන් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලදි. ඒ සඳහා නිලධාරීන් 14 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ අතර 2016 වර්ෂයට අවසාන වීමට ප්‍රථම ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු තනතුරු 03ක් සඳහා ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. අනෙකුත් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම 2016 වර්ෂය තුළ සිදුකල අතර බඳවා ගැනීම 2017 මුල් කාර්තුව තුළ නිම කිරීමට අපේක්ෂිතය.

❖ **වාහන අපහරණය**

2016 වර්ෂය තුළ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සතුව පැවති ධාවනයෙන් ඉවත්කර තිබු වාහන 6ක් අපහරණය කිරීමට කටයුතු කරන ලද අතර එමඟින් රු.මිලියන 7.59කට අධික මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට හැකියාව ලැබිණි.

## 9.2. සැලසුම් අංශය

❖ **වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා ප්‍රගති සමාලෝචන රැස්වීම්.**

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනවල සංවර්ධන වැඩ සටහන් හා ව්‍යාපෘතිවලට අදාල ක්රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2016 වර්ෂය සඳහාද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතනවලට අදාලව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදී.

වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්රියාත්මක කිරීම නිරීක්ෂණයට, ඇගයීමට හා මඟපෙන්වීම සඳහා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නිවාස ක්ෂේත්‍රය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 38ක් ද ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 29ක් ද වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 67ක් 2016 වර්ෂයේදී පවත්වන ලදී. මීට සමගාමීව අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍ර ආවරණව වන පරිදි පිළිවෙලින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 16ක් හා 11ක් පැවැත්වීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර ඇත. මෙමඟින් නිවාස හා ඉදිකිරීම් යන ක්ෂේත්‍රයන්හි අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ලබා දීමට හැකියාව ලැබුණි.

❖ **ප්‍රගති වාර්තා හා ව්‍යාපෘති යෝජනා**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්තුමය වශයෙන් 2015 වර්ෂයේදී ප්‍රගති වාර්තා 4ක් සම්පාදනය කරන ලද අතර ඒවා අදාල ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. එසේම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලබන අතර ඊට අදාල වූ ප්‍රගති වාර්තා 4ක් ද අමාත්‍යාංශය විසින් සකස් කර ඉදිරිපත් කර ඇත. තවද 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ජනාධිපති කාර්යාලය වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මඟින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ අරමුණින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති යෝජනා 26ක්, භාණ්ඩාගාර අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මෙම වර්ෂයේදී අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

❖ **අමාත්‍යාංශයේ ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව**

සෑම වර්ෂයකම අයවැය විවාද කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව මෙම වර්ෂයේද අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි ප්‍රගතිය හා ව්‍යාපෘති යෝජනා හා සැලසුම් ද සමඟින් සකස් කර නිසි කලට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

මීට අමතරව ජනාධිපති කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජනාධිපති කාර්යය සාධක බලකා 4ට අදාල වැඩසටහන්ද මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආදර්ශ ගම්මාන තුළ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

## 9.3. නිවාස අංශය

❖ **ලෝක ජනාවාස දිනය**

1985 වසරේදී බටහිර ඉන්දීය කොදෙව් දූපත්හි ජැමෙයිකාවේ කිංස්ටන් නුවර පැවති එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිසම් සැසිවාරය වෙත එවකට අග්‍රාමාත්‍ය දිවංගත ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කළ යෝජනාවක් මත පදනම්ව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්

ප්‍රකාශයට පත් කළ "ලෝක ජනාවාස දිනය" 1986 වසරේ සිට අඛණ්ඩව නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයට අදාලව විවිධ වූ තේමාවන් යටතේ සැමරුම් සිදු කරනු ලැබීය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය සෑම වසරකම ඔක්තෝම්බර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය සැමරීම සිදු කරනු ලබන අතර එය මෙම වසරේ ඔක්තෝම්බර් මස 03 වන දිනට යෙදී තිබුණි. මෙම ජාත්‍යන්තර දින සැමරුම නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයේ වඩාත් ඵලදායී වැඩසටහනක් ලෙසින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජනතාවගේ මූලික අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ක්‍රියාවට නංවනු ලැබීය.

ලෝක ජනාවාස දිනයේ 30 වන සැමරුම "නිවාසකරණය මුල්තැනට" (Housing at the Centre) යන තේමාව යටතේ මෙවර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දී පැවැත්වුණි. එහිදී නිවාස 24කින් සමන්විත "සුගලාදේවිගම" නව ආදර්ශ ගම්මානය අතිගරු ජනාධිපතිතුමන් අතින් ප්‍රතිලාභී ප්‍රජා අයිතියට පත් කෙරුණි.

මෙයට අමතරව ජනාවාස දිනය නිමිති කොට ගෙන "විසිරි නිවාස ණය", සිමෙන්ති ආධාර හා වකුගඩු රෝගීන් සඳහා නිවාස ආධාර ලබා දීම, "ශිල්ප සවිය"යටතේ බඳවාගත් දිස්ත්‍රික්කයේ අභ්‍යාසලාභීන්ට වෘත්තීය උපකරණ, නිල ඇඳුම් හා උපකරණ, පෙළපොත් ලබා දීම හා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ආරම්භ කළ "වකුගඩු ජාතික අරමුදල" සඳහා රුපියල් මිලියනයක් පරිත්‍යාග කිරීමද සිදු කරන ලදී.

ලෝක ජනාවාස දිනයට සමගාමීව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් වකුගඩු රෝගය බහුලව පවතින පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියාපදිංචි වී ඇති පෙර පාසල් 76ක දරුවන්ට පානීය ජලය සුරක්ෂිතව පරිහරණය කිරීම සඳහා වතුර පෙරණය බැගින් ලබා දීමට කටයුතු කරන ලදී.

මෙයට සමගාමීව අඩු පහසුකම් සහිත නාගරික ජනාවාසවල ජීවත් වන ළමුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් ඉස්මතු කරනු වස් සහ මානව ජනාවාස ක්ෂේත්‍රවලට අදාලව ප්‍රජාවගේ අවබෝධය වර්ධනය කරනු පිණිස වැඩසටහන් රැසක් දියත් කෙරිණි.






❖ **ජාතික නිවාස ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කිරීම.**

වත්මන් රජයේ දැක්ම නිරූපණය වන පරිදිත්, නාගරීකරණය, ස්වභාවික විපත්වල බලපෑම, තිරසාර මානව ජනාවාස සංවර්ධන සංකල්පය ක්‍රියාත්මක කිරීම යන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ජාතික නිවාස ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කිරීමට 2016 ජූලි 07 දිනැතිව අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා වන අනුමැතිය 2016.07.12 වන දින ලැබී ඇත. ඒ අනුව මානව ජනාවාස පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත සංස්කරණ මණ්ඩලයක් මඟින් ජාතික නිවාස ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කිරීමට පියවර ගෙන ඇත. යාවත්කාලීන

කරන ලද නිවාස ප්‍රතිපත්තිය 2017 වර්ෂය තුළ එළිදැක්වීමට කටයුතු සම්පාදනය කර ඇත.



❖ **සැමට සෙවණ ජාතික නිවාස වැඩසටහන මුල්කොටගත් ජාත්‍යන්තර ක්‍රියාකාරකම්**

2016 වසරේදි නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය නිවාස හා ජනාවාසකරණය පිළිබඳ ජාත්‍යන්තර කාර්යයන් රැසකට සිය දායකත්වය ලබාදෙනු ලැබීය. වසර 20කට වරක් එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිෂමේ දායකත්වයෙන් පවත්වනු ලබන “හැබිටැට් iii” ජාත්‍යන්තර සමුළුව උදෙසා ඉදිරිපත් කරන ශ්‍රී ලාංකික ජාතික වාර්තා සැකසීම නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් එයට අනුබද්ධිත ආයතන සහ නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ දායකත්වයෙන් සිදුවිය.

මෙයට අමතරව මෙම ජාත්‍යන්තර සමුළුව සඳහා පැවති පූර්ව සුදානම් සමුළු දෙකක් චෙක් ජනරජයේ ප්‍රාග් නුවර සහ ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ දී පැවැත්විණි. මේ සඳහා ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම් සහභාගිවී “හැබිටැට් iii” ජාත්‍යන්තර සමුළුව සංවිධානය කිරීම සඳහා වූ සිය දායකත්වය ලබාදෙනු ලැබීය.

2016 ඔක්තෝම්බර් මාසයේදී “හැබිටැට් iii” ජාත්‍යන්තර සමුළුව, ඉක්වදෝර් නගරයේ ක්විටෝ නගරයේදී පැවැති අතර, නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික බණ්ඩාරනායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක් මෙම ද්වි දශක සමුළුවට සහභාගි විය.

නව නාගරික න්‍යාය පත්‍රය පෙරටුකොටගත් නිවාසයන් හි තිරසාර නාගරික සංවර්ධනය, ශීර්ෂකොට මෙම ද්වි දශක සමුළුව පැවැත්වූ අතර, එහිදී ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම විසින් “හැබිටැට් iii” ජාත්‍යන්තර සමුළුව තුර්කියේ ඉස්තාන්බූල් නගරයේ දි පැවැත්වූ අවස්ථාවේ සිට ගතවූ වසර 20ක කාලය තුළ ශ්‍රී ලංකාව හා කලාපය තුළ ක්‍රියාත්මකවූ නිවාස හා ජනාවාස සංවර්ධන කාර්යයන් හා හැබිටැට් iii සමුළුව තේමාකොට පැවැත්වෙන සමුළු ක්‍රියාකාරකම් පිළිබඳ කරුණු දැක්වීම ද සිදුකරනු ලැබිය.

සහභාගිත්ව නිවාස සංවර්ධනය මුල්කොට ගෙන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන නිවාස හා ජනාවාස සංවර්ධන කාර්යයන් පිළිබඳව මෙම සමුළුවේදී විශේෂ අවධානයක් යොමුවූ අතර, නාගරික හා ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම්හි පවත්නා පරතරය අවම කරගැනීම නිවාස හා ජනාවාසකරණයේ මූල්‍ය කළමනාකරණය වැනි කාර්යයන් පිළිබඳව මෙම සමුළුවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය.




ආසියා පැසිෆික් නිවාස අමාත්‍යවරුන්ගේ සමුළුව 2016 දෙසැම්බර් මස ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පැවැත්විණි. මේ සඳහා ශ්‍රී ලංකාවෙන් නියෝජිත කණ්ඩායමක් සහභාගී වූ අතර සමුළුවේ ප්‍රධාන ක්‍රියාකාරී කණ්ඩායම් පහෙන් එක් ප්‍රධාන ක්ෂේත්‍රයක් එමඟින් නියෝජනය කෙරිණි.

2017 වර්ෂය 1987 ජාත්‍යන්තර නිවාස වසරේ 30 වන සංවත්සරය වේ. එම 30 වන සැමරුම නිමිත්තකොට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කෙරෙන "සැමට සෙවණ" නිවාස වැඩසටහන පිළිබඳ ජාත්‍යන්තර අවධානය යොමුකිරීම අරමුණුකොට ජගත් නිවාස සමුළුවක් පැවැත්වීම අපේක්ෂා කෙරේ. එකී සමුළුව සඳහා වූ පූර්ව ක්‍රියාකාරකම් රැසක් ද මෙම වසර තුළ සිදුවිය.

❖ **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.**

"සැමට සෙවණ" ජාතික නිවාස වැඩසටහන ඇතුළුව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන සියලු නිවාස සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහාත් නිවාසකරණයේ නියුතු සියලු ආයතන හා සංවිධානයන් හි සහය ඇතිව යටිතල පහසුකම්, ජීවනෝපාය ඇතුළු සමාජ ආර්ථික සංවර්ධනය උදෙසාත් දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ගැමි නිවාස කමිටු ස්ථාපනය කිරීමට අමාත්‍ය මණ්ඩල සටහනක් 2016.06.22 දින ඉදිරිපත් කරන ලදුව ඒ සඳහා 2016.06.28 දින මුදල් විෂයභාර ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණවලට යටත්ව අනුමැතිය ලැබී ඇත.

❖ **බම්බලපිටිය මහල් නිවාස ප්‍රතිසංවර්ධනය කිරීම.**

බම්බලපිටිය මහල් නිවාස ලෙස ප්‍රචලිත මැදි ආදායම්ලාභීන් සඳහා වන බද්ධ නිවාස සංකීර්ණයක් 1960 දශකය මුල් භාගයේදී බම්බලපිටියේ ඉහළ වටිනාකමක් සහිත භූමි ප්‍රදේශයක ඉදිකරන ලදී. මෙම ගොඩනැගිල්ල වසර 65 කටත් වඩා පැරණිය. එම නිවාස ප්‍රතිසංවර්ධනය කිරීමක් නොමැතිව ජීවිත අවදානම් ඇති කරමින් වසර ගණනාවක් තිස්සේ දිරා පත් වෙමින් පවතී. ඒ වටා සිදුවන ශීඝ්‍ර නාගරික සංවර්ධනයත් සමඟ, මෙම දේපල නොදියුණු නිවාස පෙළක් බවට පත් වීමේ අවධානමක් පවතී.

ඒ අනුව, සභාධිපත්‍ය හිමිකරුවන්ගේ හිමිකම් අයිතින් සහතික කරමින් ඉහළ ආදායම් උපදවන නාගරික භූමිභාගයක් ලෙස ආයෝජන මණ්ඩලය විසින් තෝරා ගත් ආයෝජකයකු හරහා බම්බලපිටිය මහල් නිවාස ප්‍රතිසංවර්ධනය අධීක්ෂණයට සහ එහි ක්‍රියාත්මක කිරීමේ විවිධ වූ අදියරයන් හරහා ව්‍යාපෘතියට මඟපෙන්වීමට බහු ආයතනික මෙහෙයුම් කමිටුවක් පත් කරන ලදී.

ප්‍රතිසංවර්ධන යෝජනා පිළිබඳව සහ ඔවුන්ට සපයා දෙනු ලබන පුනස්ථාපන පහසුකම් පිළිබඳ පැහැදිලි කිරීම සඳහා මෙහෙයුම් කමිටුවේ උපදෙස් මත බම්බලපිටිය මහල් නිවාසවල සියලු කළමනාකරණ සංස්ථාවන් සමඟ දීර්ඝ සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡා පදිංචිකරුවන් සමඟ අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබන අතර එම පදිංචිකරුවන්ගේ යෝජනා මත පදනම්ව සැලසුම සඳහා වෙනස්කම් සිදු කරනු ලැබේ.

❖ **1972 අංක 07 දරණ ගෙවල් කුලී පනතෙහි රෙගුලාසි සංශෝධනය කිරීම.**

2016 අගෝස්තු 01 වන දින අංක 1978/4 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් මෙම පනතෙහි 43 වන වගන්තිය යටතේ රෙගුලාසි නිකුත් කිරීමට අදාලව නව අයිතමයන් දෙකක් එකතු කර එම උපලේඛනය සංශෝධනය කෙරිණි. එම නව අයිතමයන් ද්විත්වය පහත පරිදි වේ.

(5). යම් ස්ථානයක ගෙහිමියා, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත යටතේ හෝ පළාත් සභාවේ යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් හෝ රජය, රාජ්‍ය සංස්ථාවක්, පොදු අධිකාරියක් හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන විට එම ස්ථානය මෙම පනතේ කාර්යය සඳහා බැහැර කරන ලද ස්ථානයක් විය යුතුය.

(6). යම් ස්ථානයක කුලී නිවැසියා, පළාත් පාලන ආයතනයක්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත යටතේ හෝ පළාත් සභාවේ යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් හෝ රජය, රාජ්‍ය සංස්ථාවක්, පොදු

අධිකාරියක් හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන විට එම ස්ථානය මේ පනතේ කාර්යය සඳහා බැහැර කරන ලද ස්ථානයක් විය යුතුය.

මෙම රෙගුලාසි ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව 2016.11.26 දින පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇත.

❖ **නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළ නිවාස අංශයේ දැවැන්ත පිබිදීමකට අවශ්‍ය පසුබිම නැවත සකස් කරමින් පවතී. මේ සඳහා 2015 වර්ෂයේදී රුපියල් මිලියන 3.702 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ආදර්ශ ගම්මාන ඉදිකිරීම්, විසිරි නිවාස සංවර්ධනය, නිවාස කපලාරු කිරීමේ වැඩසටහන් වැනි විවිධ වූ නිවාස ඉදිකිරීමේ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එකී සාර්ථකත්වය හේතුවෙන් 2016 වර්ෂය සඳහා නිවාස සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙම අමාත්‍යාංශයට රුපියල් මිලියන 5.8ක ප්‍රතිපාදන ප්‍රමාණයක් හිමිවිය. එම ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝගී කර ගනිමින් විවිධ වූ නිවාස වැඩසටහන් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර අමාත්‍යාංශයට අනුබද්ධිත ජාතික අධිකාරිය, නිවාස සංවර්ධන අධිකාරිය,නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වැනි ආයතන මෙම කර්තව්‍යයේදී විශාල මෙහෙයක් ඉටු කරන ලදී.

ඒ අනුව විසිරි නිවාස වැඩසටහන, ආදර්ශ ගම්මාන වැඩසටහන, උදාකළ ගම්මාන වැඩසටහන, වකුගඩු රෝගී පවුල් සඳහා නිවාස වැඩසටහන, වැලිඔය විශේෂ නිවාස ව්‍යාපෘතිය, මැදි ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ කඩිනම් වැඩසටහන, හා ලුනාව නිවාස ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන වැඩසටහන් අතුරින් කිහිපයක් වේ.

- **ආදර්ශ ගම්මාන වැඩසටහන**

ස්වකීය ඉඩමක් හා නිවසක් නොමැති පවුල් ඒකක ඉලක්ක කර ගනිමින් 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද ආදර්ශ ගම්මාන වැඩසටහන දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මෙම අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ 2016 වර්ෂයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව 2016 වර්ෂයේදී ඉලක්කගත නිවාස ඒකක 4500 ඉක්මවා යමින් භාණ්ඩාගාර අරමුදල් භාවිතයෙන් පමණක් නව ආදර්ශ ගම්මාන 147ක නිවාස 4641ක් ඉදිකිරීම ආරම්භ කළ අතර, සෙවණ ආධාර යටතේද නව ආදර්ශ ගම්මාන 41ක නිවාස 896ක් ඉදිකිරීම් ආරම්භ කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව නව නිවාස 5537ක ඉදිකිරීම් මෙම වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා වියදම් කළ සමස්ත මුදල රුපියල් මිලියන 1100.072කි.




තවද 2015 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද ආදර්ශ ගම්මාන 38කින් ගම්මාන 15ක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පත් කිරීමට මෙම වර්ෂයේදී හැකියාව ලැබුණි.

මීට අමතරව ශ්‍රී ලංකාවේ ජීවත් වන අන්ත දිළිඳු ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා දිවයින පුරා එක් දිස්ත්‍රික්කයකට තිරසර ආදර්ශ ගම්මාන 20ක් බැගින් වූ නිවාස ව්‍යාපෘති 500ක් ඉදිකිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා හා ගරු නිවාස හා ඉදිකිරීම්

අමාත්‍යතුමා විසින් 2016.09.30 දිනැතිව ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර එකී වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- **වැලිඔය විශේෂ නිවාස ව්‍යාපෘතිය**

දශක තුනකට වැඩි කාලයක් පුරාවට මෙරට පැවති ජනවාර්ගික ගැටුම් හේතුවෙන් ස්වකීය නිවාස අහිමි වූ මුලතිවු දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රදේශයේ නිවාසලාභීන් සඳහා නව නිවාස ඉදිකිරීම සහ පවත්නා නිවාස වැඩිදියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කිරීමට මෙම වර්ෂයේදී හැකියාව ලැබිණි. මේ යටතේ නිවාස 1084ක ඉදිකිරීම් ආරම්භ කළ අතර 2016 වර්ෂය අවසානය වන විට ඒ සඳහා වැය කරන ලද සමස්ත මුදල රුපියල් මිලියන 310.845ක් විය.

- **විසිරි නිවාස වැඩසටහන**

මෙම වැඩසටහන මඟින් පවත්නා ගම්මානවල තාවකාලික නිවාස හා අනු පවුල් සඳහා නව නිවාස ඉදිකිරීමත් අර්ධනිමි නිවාස වැඩිදියුණු කිරීමත් සිදු කරනු ලබයි. මේ යටතේ නව නිවාස සඳහා රු. 300,000ක උපරිමයකට යටත්ව ණය මුදලක් හා වැඩිදියුණු කළ යුතු නිවාස සඳහා උපරිමය රු.200,000ක් දක්වා වූ ණය මුදලක් සහන පොළී අනුපාතිකයක් යටතේ ලබා දීම සිදුකරනු ලබන අතර නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සපයනු ලබයි.

දීප ව්‍යාප්තව මෙම වැඩසටහන යටතේ විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් උප වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වේ. ඒවා අතර වැන්දඹු කාන්තා නිවාස වැඩසටහන හා උදාකළ ගම්මාන නිවාස වැඩසටහන විශේෂිත වේ.

2016 වර්ෂයේදී විසිරි නිවාස වැඩසටහන යටතේ නිවාස 26000ක් සංවර්ධනය කිරීමට ඉලක්කගත කළ අතර වර්ෂය අවසානය වන විට නිවාස 35987ක් සංවර්ධනය කිරීමට හැකියාව ලැබුණි. එය ඉලක්කගත නිවාස ප්‍රමාණය ඉක්මවා යන්නකි. මේ සඳහා වැය කරන ලද සමස්ත මුදල රුපියල් මිලියන 3697.33 කි.



- **වකුගඩු රෝගී පවුල් සහ අන්ත දිළිඳු පවුල් සඳහා නිවාස වැඩසටහන්**

වකුගඩු රෝගයෙන් පීඩාවට පත්වී සිටින හා අන්ත දිළිඳු පවුල්, ආර්ථික හා සමාජ දුෂ්කරතාවයන් රැසකට මුහුණ පා සිටින බව අධ්‍යනය කරන ලදුව එලෙස පීඩාවට පත් වී ඇති පවුල් සඳහා විශේෂිත නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අතිගරු ජනාධිපතිතුමා සමඟ ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2016 ජුනි මස 06 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.

මෙමඟින් එක් පවුලක් සඳහා රු.ලක්ෂ 5 ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ප්‍රදානය කරනු ලබන අතර එම මූල්‍ය දායකත්වයට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණික සහයෙන් එම නිවාස ඒකක ඉදිකර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදී. ඒ අනුව දිවයිනේ හඳුනාගත් දිස්ත්‍රික්ක කිහිපයක් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන 2016 වර්ෂය පුරාවට ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ නිවාස 700ක් ඉදිකිරීමට හැකියාව ලැබුණු අතර වැයකළ මුළු මුදල රුපියල් මිලියන 74.56 කි.

- **නිවාස පිළිසකර කිරීමේ වැඩසටහන**

අඩක් නිමවූ හෝ විධිමත් නිමාවක් නොමැති නිවාස රැසක් දිවයින පුරා විසිරි ඇති අතර එම නිවාස විධිමත් පරිදි පිළිසකර කර ගැනීම සඳහා අවශ්‍ය සිමෙන්ති අධාර ලබා දීමේ වැඩසටහනක් 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එම වැඩසටහන් තුළින් ලබා ගත් අත්දැකීම් පාදක කර ගනිමින් 2016 වර්ෂයේදී නිවාස 75,000ක් පිළිසකර කිරීම සඳහා සිමෙන්ති ආධාර ලබා දීමේ වැඩසටහනක් අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලදී.

දිවයිනේ සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර අපේක්ෂිත නිවාස ඒකක 75,000 අතුරින් නිවාස ඒකක 71,498 ක පිළිසකර කිරීමේ කටයුතු අවසන් කිරීමට මෙම වර්ෂයේදී හැකියාව ලැබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස 95.33% ක් විය. මේ සඳහා ආයෝජනය කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 641.013 කි.






- **මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ කඩිනම් වැඩසටහන**

පසුගිය දශක කිහිපය පුරාවටම ක්‍රියාත්මක වූ නිවාස සංවර්ධනය සඳහා වන රජයේ වැඩසටහන් විශේෂ ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබුවේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම වෙනුවෙනි. එම සංකල්පය වෙනස් කරමින් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2015 වර්ෂයේ මහ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වූ පොරොන්දුවක් ක්‍රියාවට නංවමින් මධ්‍යම පාන්තිකයන් උදෙසා වූ නිවාස සංවර්ධන වැඩසටහනක් 2016 වර්ෂයේදී ආරම්භ කිරීමට මෙම අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

ඒ අනුව මෙම කඩිනම් වැඩසටහන පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ මැදිහත් වීමෙන් එකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන අතර එමඟින් මධ්‍යම පාන්තිකයින්ට, රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයින්ට දැරිය හැකි මිලක් යටතේ නිවාස මිලදී ගැනීමට අවස්ථාව සලසා දී ඇත. මෙම නිවාස යෝජනා ක්‍රම සියලුම යටිතල පහසුකම් සමඟින් දිවයිනේ උප නගර ආශ්‍රිතව පවතින රජය සතු ඉඩම්වල ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ.

2016 වර්ෂය තුළ මෙම නිවාස යෝජනා ක්‍රමය යටතේ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති 4ක වැඩ ආරම්භ කිරීමට මෙම අමාත්‍යාංශයට හැකියාව ලැබුණි. නිවාස 196කින් සමන්විත වාද්දුව "සී බ්‍රීස්" නිවාස ව්‍යාපෘතිය, නිවාස 352 කින් සමන්විත අතුරුගිරිය - පනාගොඩ "ග්‍රීන් වැලී" නිවාස ව්‍යාපෘතිය, නිවාස 124 කින් සමන්විත රාගම "ලාවන්‍යා හයිට්ස්" නිවාස ව්‍යාපෘතිය හා නිවාස 860 කින් සමන්විත හෝමාගම "මවුන්ට් ක්ලිෆර්ඩ් රේන්ජ්" නිවාස ව්‍යාපෘතිය මෙම වසරේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතින් වේ.

❖ **ඉඩම්/ නිවාස සඳහා හිමිකම් ඔප්පු ලබා දීම**

ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8(1) උප වගන්තිය ප්‍රකාරව ඉඩම්/ නිවාසවල නීතිමය අයිතිය බැහැර කිරීම සිදු කරනු ලබන අතර මෙම වර්ෂය සඳහා ඉලක්කගත නිවාස/ඉඩම් ඔප්පු 3000 අතුරින් වර්ෂය අවසාන වන විට හිමිකම් ඔප්පු 1851ක් ප්‍රදානය කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 61.7% කි. මීට අමතරව ඉලක්කගත බදු ඔප්පු 2000 ඉක්මවායමින් බදු ඔප්පු 7599ක් ලබා දීමටද මෙම වසරේදී හැකියාව ලැබුණි.

❖ **සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම, කළමනාකරණ සංස්ථා හා කමිටු ලියාපදිංචි කිරීම.**

අමාත්‍යාංශයට අනුබද්ධිත, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපලවලට අදාල සහතික නිකුත් කිරීම සිදු කරනු ලබන අතර සහාධිපත්‍යය දේපලවල කළමනාකරණ සංස්ථා හා කමිටු ලියාපදිංචිය ද සිදු කරනු ලබයි.

ඒ අනුව මේ වසරේදි ඉලක්කගත පූර්ණකාලීන, අර්ධකාලීන හා තාවකාලික සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම් 102 ක් වර්ෂය අවසාන වන විට නිකුත් කර අවසන් කිරීමට හැකියාව ලැබීම සුවිශේෂී වේ. තවද අපේක්ෂිත කළමනාකරණ සංස්ථා ලියාපදිංචි කිරීම්, ලියාපදිංචිය අලුත්කිරීම් හා අක්‍රීය කළමනාකරණ කමිටු නැවත සක්‍රීය කිරීම් 825ක් අතුරින් 579ක ප්‍රගතියක් අත්කර ගැනීමට හැකියාව ලැබී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 70%ක් වේ.

❖ **නිවාස අවශ්‍යතාවය පිළිබඳ දත්ත රැස්කිරීමේ සමීක්ෂණය**


ශ්‍රී ලංකාවේ වර්තමාන නිවාස අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන කරන ලද දත්ත හා තොරතුරු පද්ධතියක් නොමැති බැවින් ජාතික නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අදාල ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී හා සැලසුම් කිරීමේ දී දැඩි අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය. දිවයිනේ නිවාස අවශ්‍යතාවය පිළිඳව විවිධ මාර්ගයන් තුළින් ලබා ගන්නා ලද දත්ත හා තොරතුරු පරස්පර වීමත්, එම දත්ත යල්පැන තිබීම නිසාත් එම දත්ත හා තොරතුරුවලින් වර්තමාන නිවාස අවශ්‍යතාවයේ යථා ස්වරූපය නිරූපණය නොවීය. 2011 වර්ෂයේදී ස්ථිර නිවාස අවශ්‍යතාවය ලක්ෂ 15 ක් ලෙස පුරෝකථනය කර තිබූ නමුත්, 2012 වර්ෂයේ දී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කරන ලද සමීක්ෂණයට අනුව එය ලක්ෂ 6.0 දක්වා අඩු වී ඇත. ඒ අනුව තොරතුරු එකිනෙකට පරස්පර බව විද්‍යාමාන වේ.


මේ නිසා මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සියලු ග්‍රාම නිලධාරී වසම්වල නිවාස අවශ්‍යතාවය පිළිබඳ දත්ත රැස්කිරීම සඳහා සමීක්ෂණයක් කිරීමට කටයුතු කරන ලදී. මෙම සමීක්ෂණයට දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා අදාල අනෙකුත් අමාත්‍යංශ හා ආයතනවල නිලධාරීන්ගේ සේවාවන් ලබා ගැනීම සඳහා නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් 2016.05.09 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2016.05.17 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.


මෙම නිවාස අවශ්‍යතාවය පිළිබඳ දත්ත පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටළුවක් වන ජාතික නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙහිලා දීර්ඝ කාලීන වැඩසටහනක්සැකසීමට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් කටයුතු කරමින් පවතී.

මේ වන විට දිවයිනේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලම සිය කොට්ඨාසයේ පවතින නිවාස අවශ්‍යතාවය පිළිබඳ දත්ත ලබා දී ඇති අතර එසේ ලැබී ඇති මුළු නිවාස අවශ්‍යතා පිළිබඳ දත්ත සාරාංශයක් පසු පිටෙහි දැක්වේ.

| අක්ෂර | නිවාස අවශ්‍යතාවය | පවුල් |
|---|---|---|
| A | තාවකාලික නිවාස | 278,319 |
| B | පොල් අතු සෙවිලි කළ නිවාස | 44,413 |
| C | තහඩු සෙවිලි කළ නිවාස | 441,891 |
| D | කපලාරු කළයුතු නිවාස | 839,029 |
| E | අඩක් ඉදිකළ නිවාස | 384,912 |
| F | නිවාස ඉදිකිරීමට ඉඩමක් නැති, නිවාස නැති පවුල් | 215,604 |
| G | නිවාස ඉදිකිරීමට ඉඩමක් ඇති, නිවාස නැති පවුල් | 166,567 |
| H | වෙනත් ප්‍රදේශයක පදිංචි තාවකාලික කුලියට / බද්දට පැමිණි පවුල් | 79,562 |
| I | ස්ථිර පදිංචියට පැමිණි කුලියට / බද්දට පැමිණි පවුල් | 83,520 |
| J | තාවකාලිකව රැකියාව සඳහා නිල නිවාසවල සිටින පවුල් | 29,832 |
| A-J දක්වා එකතුව | | 2,563,649 |
| | යටිතල පහසුකම් සැපයීම | |
| K | විදුලිය නැති | 167,252 |
| M | මාර්ග පහසුකම් නැති | 180,062 |
| N | සනීපාරක්ෂක පහසුකම් නැති | 194,308 |
| O | පිරිසිදු පානීය ජලය නැති | 510,757 |
| K-O දක්වා එකතුව | | 1,052,379 |



## 9.4. තාක්ෂණ අංශය

### ❖ ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව විසින් ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබිය. එලෙස සකස් කරනු ලැබූ ජාතික ප්‍රතිපත්තියේ රජය සහ ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශවකාර ආයතන විසින් ක්‍රියාවට නැංවිය යුතු ක්‍රියා මාර්ග දහ අටක් (18) අන්තර්ගත වේ.

ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ නියාමනය, ප්‍රමිතිකරණය, ධාරිතා වර්ධනය හා පහසුකම් සැපයීම මඟින් ජාතික සංවර්ධන අවශ්‍යතා සපුරාලන්නා වූ කාර්යක්ෂම ඉදිකිරීම් කර්මාන්තයක් ශ්‍රී ලංකාවේ නිර්මාණය කිරීමයි. රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය සම්බන්ධ වී ඇති ඉදිකිරීම් කර්මාන්තයට, පොදුවේ මෙම ප්‍රතිපත්තිය අදාල වනු ඇත.

තවද ඉදිකිරීම් කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන්ට උපාය මාර්ගික නායකත්වය සැපයීම, තිරසාර සංවර්ධනය, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම් උත්තේජනය කිරීම, අඩු පිරිවැය, ආපදා ප්‍රත්‍යස්ථිතික සහ පරිසර හිතකාමී තාක්ෂණය, ගොඩනැගිලි ද්‍රව්‍ය හා පද්ධති ප්‍රවර්ධනය කිරීම, යෝග්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය සහ පර්යේෂණ කටයුතු ප්‍රචාරණය හා ප්‍රකාශනයට පත් කිරීම, ප්‍රමිති, චර්යා ධර්ම සහ භාවිත සංග්‍රහ සම්පාදනය කිරීම සහ ඉදිකිරීම් සේවා අපනයන ප්‍රවර්ධනය කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණුවලට අයත් වේ.

2016 නොවැම්බර් 08 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මෙම ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ එය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණි.

### ❖ ස්ථාවර තාක්ෂණික මිල ගණන් කමිටුව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ස්ථාවර තාක්ෂණ කමිටුව විසින් 2016 වර්ෂයේදී ප්‍රධාන ව්‍යාපෘති 45කට අදාළව මිල ගණන් ඇගයීම් සිදු කරන ලද අතර රු.බිලියන 3.651ක් සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ඇසුරින් රු.බිලියන 0.556ක් රජයට ඉතිරිකර දීමට කටයුතු කරන ලදී. රජයේ ව්‍යාපෘතිවල මූල්‍ය විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා මෙම තාක්ෂණික මිල ගණන් කමිටුව බෙහෙවින් දායක වී ඇත.

### ❖ රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතන සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා දීම.

රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවලට මෑතකදී රාජ්‍ය අංශයේ සිදු කරන ලද වැටුප් වැඩිවීමත් සමඟ පුද්ගලික අංශය සමඟ තරඟකාරීව කොන්ත්‍රාත් ලබා ගැනීමේදී ඇති දුෂ්කරතාවය අමාත්‍ය මණ්ඩලයේදී ගරු අමාත්‍යතුමා විසින් පෙන්වා දීමෙන් අනතුරුව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් නිවාස හා ඉදිකිරීම්, මුදල්, මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් ඒකාබද්ධ වාර්තාවක් ලබා ගන්නා ලදී.

එම වාර්තාව අනුව පුද්ගලික අංශයේ තරඟකාරී කොන්ත්‍රාත්වල මිල පාලනය, පුහුණු ශ්‍රමිකයින් රැසකගේ රැකියා සුරක්ෂිත භාවය, ඉංජිනේරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, ප්‍රමාණ සමීක්ෂකයින් හට මනා වෘත්තීමය පුහුණුව, රටේ හදිසි අවශ්‍යතාවයන්හිදී අවශ්‍ය සේවාවන් සපයන ආයතනයන් ලෙස ඉදිකිරීම් කර්මාන්තයේ තත්ත්ව ප්‍රමිතීන් රැක ගැනීම සඳහා මෙම ආයතන රැක ගැනීමේ අවශ්‍යතාවය පැහැදිලි කර ඇත.

එම වාර්තාවෙහි මෙම අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 2016-2017 වර්ෂයන් සඳහා එකවර වටිනාකම රුපියල් මිලියන 16,000ක ව්‍යපෘති ද රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට එකවර වටිනාකම රුපියල් මිලියන 7,300ක ව්‍යාපෘති ද කරගෙන යා යුතු බවට නිර්දේශ කර ඇත.

මේ සඳහා රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා මාර්ගයෙන්ඉහත වටිනාකමට සරිලන ප්‍රමාණවත් ඉදිකිරීම් ව්‍යාපෘති සංඛ්‍යාවක් මෙම ආයතනවලට නිත්‍ය වශයෙන් ලබාදිය යුතු බවට ද නිර්දේශ කර ඇත.

එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර රාජ්‍ය අංශයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා දීම සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට දන්වා ඇත. මෙය ක්‍රියාත්මක කිරීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙහි හා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙහි ඉදිරි පැවැත්මට මහෝපකාරී වනු ඇත.

❖ **ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රමාදයන් පිටුදැකීම.**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් අංශයට අදාල රාජ්‍ය ආයතන 6ක ප්‍රගතිය සමාලෝචනය කිරීම මාසිකව සිදු කරනු ලබන අතර එහිදි ජාතික වශයෙන් වැදගත් ඉදිකිරීම් කර්මාන්තයට අදාල ගැටළු අධ්‍යයනය කිරීම මෙන්ම, ඒ සඳහා විසඳුම් සෙවීම සඳහා ද කටයුතු කරනු ලැබේ.

ඉදිකිරීම් කොන්ත්‍රාත්වල පවත්නා ප්‍රමාදයන් පිළිබඳව එහිදී නිරතුරුව වාර්තා වූ බැවින්, ඉදිකිරීම් කොන්ත්රාත් ප්‍රමාදයන් සඳහා බලපාන ගැටළු අධ්‍යයනය කොට විසඳුම් යෝජනා කිරීම සඳහා සහාභාගීත්ව වැඩමුළුවක් 2016.09.13 වන දින නිවාස සැලසුම් හා ගොඩනැඟිලි මධ්‍යස්ථානයේ (CHPB) දී සංවිධානය කරන ලදී.

එම වැඩමුළුව සඳහා ඉදිකිරීම් කර්මාන්තයන්හි නියැලෙන රාජ්‍ය ආයතන මෙන්ම ඉදිකිරීම් සේවා සපයනු ලබන රාජ්‍ය ආයතන සමූහයක් සමඟ ප්‍රධාන කොන්ත්‍රාත් ආයතන ගණනාවක්ද සහභාගී විය. තවද පළාත් සභා කිහිපයක නියෝජනය ද වැඩමුළුව සඳහා ලබාගත හැකි විය.

එම වැඩමුළුව මඟින් ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රමාදයන්ට බලපාන පුළුල් පරාසයක් තුළ පැතිරුණු ගැටළු රැසක් හඳුනා ගැනීමට හැකියාව ලැබුණු අතර, ඒවා නිරාකරණය කර ගැනීම සඳහා කෙටි, මධ්‍ය හා දිගු කාලීනව ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ විද්වත් අදහස් ද ඉස්මතු කර ගත හැකි විය.

ඒ අනුව, 2017 වර්ෂයේ සිට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් එම විසඳුම් යෝජනාවලියට අදාල පියවරයන් දියත් කිරීමටත් එමඟින් ඉදිකිරීම් කර්මාන්තයේ ස්ථාවර පිබිදීමක් ඇති කිරීමට දායක වීමටත් අපේක්ෂිතය.

## 9.5. ජාතික නිවාස කොමසාරිස් අංශය

1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතිය යටතේ රජයට පවරාගත් දේපළ සඳහා කුලී නිවැසියන්ට ඔප්පු ලබාදීම ජාතික නිවාස කොමසාරිස් අංශය මඟින් සිදුකරන අතර 2016 වර්ෂය සඳහා එසේ ලබාදෙන ලද ඔප්පු ප්‍රමාණය 07කි. තවද රජයට පවරාගත් නිවාසවල අයිතිකරුවන් සඳහා වන්දි ලබාදීමට ද 2016 වර්ෂයේ දී අමාත්‍යාංශයට හැකි විය.

නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතිය යටතේ කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබාදීමේදී එක් එක් කුලී නිවැසියන්ගෙන්, නිවාස සඳහා තක්සේරු වටිනාකම අයකර ගන්නා ලද අතර 2016 වර්ෂයේදී එසේ අයකරගත් මුදල් නිවාස අරමුදල වෙත බැර කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

## 9.6. අභ්‍යන්තර විගණන අංශය

2016 වාර්ෂික විගණන වැඩසටහන අනුව අපේක්ෂිත විගණන වාර්තා 29 අතුරින් විගණන වාර්තා 14ක වැඩ නිම කිරීමට හැකියාව ලැබුණද, වාර්තා 15ක වැඩ අවසන් කිරීමට නොහැකි විය. මීට ප්‍රධාන හේතුව වූයේ විමර්ශන කටයුතු හා විගණන කටයුතු පිළිබඳ දැනුමක් ඇති පළපුරුදු කාර්යය මණ්ඩලය අඩු වීමයි. කෙසේවූවත් වාර්ෂික විගණන වැඩසටහන අනුව අපේක්ෂිත මූලික විමර්ශන 06හි වැඩ කටයුතුද 2016 වසර අවසන් වීමට පෙර සම්පූර්ණ කිරීමට හැකියාව ලැබුණි.

තවද වාර්ෂිකව පැවැත්වියයුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක්, කාර්තුවට එක් රැස්වීමක් බැගින් පැවැත් වූ අතර එහිදී අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවලට අදාල ගැටළු සාකච්ඡා මාර්ගයෙන් හා උපදෙස් ලබා දීම තුළින් නිවැරදි කර ගැනීමට හා ගැටළු අවම කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

# 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්



සැමට සෙවණ - ශිල්ප සවිය වැඩසටහන යටතේ ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීම



ඉදිකිරීම් කාර්මික ශිල්පීන් පුහුණු කිරීම - CETRAC පැලවත්ත



ලුනාව නිවාස යෝජනා ක්‍රමය




ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - ගන්නෝරුව



වලස්මුල්ල බස් නැවතුම්පල



කොළමුණු ඔය පාලම

# 10. 2016 වර්ෂයේදී අමාත්‍යාංශය මුහුණදුන් අභියෝග

- **නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණපාන ලද අභියෝග**

- **ඉඩම් ගැටළු**

මෙම අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතන වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විවිධ වූ නිවාස වැඩසටහන් රාශියක් මෙම වර්ෂයේදී දියත් කළ අතර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි පැන නැඟුනු ප්‍රධාන ගැටළුවක් ලෙස නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් අත්පත් කරගැනීමේදී ඇති වූ දුෂ්කරතාවය ප්‍රධාන තැනක් ගනී.

විශේෂයෙන්ම ආදර්ශ ගම්මාන වැඩසටහන් යටතේ නව ආදර්ශ ගම්මාන ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් තෝරා ගැනීමේදී මෙම තත්ත්වය දැඩිව බලපාන ලදී. කොළඹ හා ගම්පහ වැනි දිස්ත්‍රික්කයන් හී පවතින සීමිත භූමි ප්‍රමාණය තුළ එකවර නිවාස විශාල ප්‍රමාණයක් ඉදිකිරීම සඳහා සුදුසු රජය සතු ඉඩම් නොමැති වීම හේතුවෙන් එම දිස්ත්‍රික්කවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදි දැඩි බාධා එල්ල විය. මීට අමතරව කෑගල්ල, බදුල්ල, රත්නපුර හා මහනුවර වැනි නායයෑමේ වැඩි ප්‍රවණතාවයක් පවතින දිස්ත්‍රික්කවල නිවාස ඉදිකිරීම සඳහා යෝග්‍යයැයි හඳුනාගන්නා ලද ඉඩම් ප්‍රමාණය ඉතා සීමිත බැවින් දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව එම දිස්ත්‍රික්කවල ඉදි වූ නව ආදර්ශ ගම්මාන ප්‍රමාණය ඉතා අල්ප විය.

තවද හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් හි පවතින වන අලි තර්ජනය හේතුවෙන් එම දිස්ත්‍රික්කවල නිවාස ඉදිකිරීම සඳහා යෝග්‍ය ඉඩම් හඳුනාගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වුවද වර්ෂ අවසානය වන විට සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක නව ආදර්ශ ගම්මාන බොහෝමයක ඉදිකිරීම් ආරම්භ කිරීමට හැකියාව ලැබුණි.

මීට අමතරව හඳුනාගන්නා ලද ඉඩම්වල වට මැනුම් කටයුතු සිදු කිරීම, ඉඩම් කට්ටි වෙන් කිරීම හා ඉඩම් පවරා ගැනීම යන කාර්යයන්හිදී යම් යම් ප්‍රමාදවීම් සිදු වුවද වර්ෂය තුළ ඉලක්කගත නව ආදර්ශ ගම්මාන සියල්ලෙහිම ඉදිකිරීම් ආරම්භ කිරීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

කෙසේවූවද මධ්‍යම පාන්තිකයින් සඳහා වූ නිවාස යෝජනා ක්‍රමය යටතේ ඉදිකිරීමට අපේක්ෂිත නිවාස යෝජනා ක්‍රම සඳහා උප නාගරික බල ප්‍රදේශ ආශ්‍රිතව මහල් නිවාස ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් භූමියක් සහිත ඉඩම් ලබා ගැනීමට තිබූ දුෂ්කරතාවයන් හේතුවෙන් මෙම වර්ෂයේදී කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල පමණක් නිවාස යෝජනා ක්‍රම 4ක් ආරම්භ කිරීමට හැකියාව ලැබුණි.

- **නිවාස යෝජනා ක්‍රම/ ආදර්ශ ගම්මාන සඳහා යටිතල පහසුකම් ලබාගැනීමේ ගැටළු**

මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස සංවර්ධන වැඩසටහනෙහි වන නව ආදර්ශ ගම්මාන සියලු යටිතල පහසුකම්වලින් අංගසම්පූර්ණ ආදර්ශ ගම්මාන වේ. මෙම ආදර්ශ ගම්මාන සඳහා පානීය ජලය, විදුලිය හා ප්‍රවේශ මාර්ග ලබාගැනීමේදී 2016 වර්ෂයේදී අමාත්‍යාංශයට දැඩි දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවිය.

මෙහිදී මුහුණපාන ලද ප්‍රධාන ගැටළුව වූයේ පානීය ජලය ලබාගැනීමේදී ඇති වූ දුෂ්කරතාවයයි. විශේෂයෙන්ම නව ආදර්ශ ගම්මාන සඳහා පානීය ජලය ලබාගැනීමේදී අදාල ප්‍රදේශවල පවතින භූගත ජල හිඟයත්, නල ජල පහසුකම් නොමැතිවීමත් හේතුවෙන් නව නිවාස සඳහා ජල සැපයුම් ලබාදීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවිය. මීට අමතරව විදුලිය හා ප්‍රවේශ මාර්ග ලබා ගැනීමේදි ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් ඉදිකරන ලද නව ආදර්ශ ගම්මාන

බොහෝමයක් ජනතා අයිතියට පත්කිරීමට මෙම වර්ෂයේදී හැකියාව නොලැබුණි.

- **ප්‍රතිලාභීන් තෝරාගැනීම හා නිවාස ඉදිකිරීම**

නව නිවාසවලින් සමන්විත ආදර්ශ ගම්මාන ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රාදේශීය ලේකම්වරුන් මාර්ගයෙන් විනිවිදභාවයකින් යුක්තව කටයුතු කරනු ලබයි. මෙහිදී ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමේ ක්‍රමවේදය තුළ සැලකිය යුතු කාලසීමාවක් ගත වූ අවස්ථා දක්නට ලැබුණි.

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස වැඩසටහන් සියල්ලම පාහේ සහභාගීත්ව සංවර්ධන නිවාස වැඩසටහන් වන බැවින් ප්‍රතිලාභියාගේ මැදිහත්වීම සහ දායකත්වය ලබාදීම, නිවාසය ඉලක්කගත කාල පරිච්ඡේදය තුළ ඉදිකර අවසන් කිරීමට උපකාරී වේ. නමුත් ඉහත ක්‍රමවේදය අනුගමනය කරමින් තෝරාගන්නා ප්‍රතිලාභීන් ඉතා දිළිඳු ජන කොට්ඨාසයක් බැවින් සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලිය තුළ සිය ජීවනෝපායද සරිකරගනිමින් ස්වකීය නිවාස ඉදිකරගැනීමට දායකවීමේදි අපේක්ෂිත කාලසීමාව තුළ නිවසෙහි වැඩ අවසන්කර ගැනීමට හැකියාවක් නොලැබුණු අවස්ථා දක්නට ලැබිණි.

- **කාළගුණික බලපෑම්**

පසුගිය වර්ෂයේදී දිවයිනට බලපැවැත්වූ අයහපත් කාලගුණික තත්ත්වය තුළ ඇති වූ ගංවතුර තත්ත්වයන්ද නියඟයද හේතුවෙන් නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා දැඩි බලපෑම් එල්ල විය. මීට අමතරව නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය වැලි, දැව ලබාගැනීමේදී පවතින දුෂ්කරතාවයන් හේතුවෙන්ද ඉලක්කගත නිවාස සියල්ලෙහිම වැඩ අවසන් කිරීමට 2016 වර්ෂය තුළ හැකියාව නොලැබුණි.

- ❖ **ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ගැටළු**


ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන බොහෝමයක් මෙම අමාත්‍යාංශය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ආයතන වන අතර පසුගිය වසරේද රාජ්‍ය අංශයේ සැලකිය යුතු තරම් ඉදිකිරීම් ව්‍යාපෘති මෙම ආයතන වෙත නොලැබී යාම පසුගිය වසරේදී දක්නට ලැබුණි.

තවද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් පසුගිය වසර කිහිපය පුරාවටම ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා නොයෙකුත් රාජ්‍ය ආයතන විසින් එම සංස්ථාව සඳහා ගෙවිය යුතු රුපියල් බිලියනයකට ආසන්න මුදල් ප්‍රමාණය අයකරගැනීමට හැකියාවක් නොලැබීම තුළ එම සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණපාන ලදී.

- ❖ **අමාත්‍යාංශයේ පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට නොහැකිවීම**

අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(පාලන) හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන) යන තනතුරු වල පුරප්පාඩු 2016 මැද භාගයේ සිට වර්ෂය අවසානය වන තුරුද පැවතීම හේතුවෙන් අමාත්‍යාංශයේ පාලන අංශයේ රාජකාරීවලට දැඩි බාධා එල්ලවිය. මීට අමතරව සහකාර අධ්‍යක්ෂ(නිවාස), සහකාර අධ්‍යක්ෂ(ඉංජිනේරු සේවා) හා සහකාර අධ්‍යක්ෂ(නාගරික ජනාවාස) යන තනතුරුද වර්ෂය පුරාවටම පුරප්පාඩුව පැවතිණි. මීට ප්‍රධාන හේතුව වූයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ පවතින හිඟයයි.

තවද නිලධාරීන් ස්ථාන මාරුවීම්, විශ්‍රාම යාම් සහ මිය යෑම් හේතුවෙන් අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු වරින් වර ඇතිවූ අතර එම හේතුව නිසා අමාත්‍යාංශයේ දෛනික රාජකාරී කටයුතු ඉටුකිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පාන ලදී.


නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சு
Ministry of Housing & Construction